# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014** නොවැම්බර් **18** වන අඟහරුවාදා
2014 கார்த்திகை 18 செவ்வாய்க்கிழமை
Tuesday 18th November 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.48 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.48 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.48 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සියලු දෙනාටම සුභ උදෑසනක් වේවා. මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. කිහිප අවස්ථාවකදීම මම ඔබතුමන්ලා දැනුවත් කරන්න හිටියේ. සෙංකෝලය ස්ථානගත කරන අවස්ථාවේදී අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරු අපේ ඇමැතිවරු පවා ඝෝෂා කිරීම් කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ඔබතුමා නොවෙයි. ඔබතුමා වාඩිවෙන්න.

[සභාවේ ඝෝෂා]

මම ඉතාමත් ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, සෙංකෝලය ස්ථානගත කරන මොහොත දක්වාවත් සභා ගර්භය තුළ පොඩ්ඩක් ගෞරවාන්විතව හැසිරෙන්න. කැකෝ ගහනවා. ශබ්ද කරනවා. ඒ ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න.

# නිවේදන

## ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2014 සැප්තැම්බර් මස 23 වන දින සභා සම්මත වූ 2014 අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 නොවැම්බර් මස 05 වන දින අනුමැතිය ලබා දී ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා වන මුදල් විෂයය භාර අමාත්‍යවර ගරු ප්‍රසන්න රණතුංග ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් එම කාරක සභාවේ කටයුතු කර ගෙන යාමට කාර්ය පටිපාටි රීති අංක 98(8) හි විධිවිධාන අනුව පළාත් සභා මන්ත්‍රී හා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සාමාජික ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාව නම් කරන බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මා වෙත දන්වා ඇති බව මෙම සභාවට දැනුම් දී තිබෙනවා.*

*එම නම් කිරීම 2014.10.21 වන දින සිට බලපැවැත්වෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*iii*

*"2014.10.07 දින පැවති පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ මත්ද්‍රව්‍ය උවදුර රටින් තුරන් කිරීමට විධිමත් හා කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීමේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා ජනාධිපති ලේකම් වෙත යොමු කර ඇති බව කාරුණිකව දැනුම් දෙනවා."*

*iv*

*"අද දින මා විසින් පිළිගැන්වීමට නියමිත 2014.11.05 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 05 හා 06 හි 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාද කාල සටහනක් ඇතුළත්ව තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභා වාර්තා පිළිගැන්වීම යටතේ පළමුවෙන්ම ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගැන්වීමට, එම කාරක සභාවේ සභාපති, ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක සිසිර ජයකොඩි මැතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, 2014.09.23 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.11.05 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ගිය සභා වාරයේදී ඔබතුමා සමග පැමිණි එකඟතාවය අනුව ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේ අවස්ථාවේදී මන්ත්‍රීවරුන්හට ගරු අමාත්‍යතුමන්ලා වෙත ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේ අවස්ථාව විධියට මම මේ අවස්ථාව ලබා ගන්නේ. මේක ගරු ප්‍රධාන ඇමැතිතුමා වෙත ඉදිරිපත් කරන්නේ. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, මම කලින් සභාවේ ඉදිරිපත් කරපු ලිපි ලේඛන ඉදිරිපත් කළේ -

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේක ගරු ප්‍රධාන ඇමැතිතුමා වෙත ඉදිරිපත් කරන ලිපියක්. ලිපිය ඉදිරිපත් කරන අවස්ථාව ලබා ගන්නයි. ගියවර මහ සභාවේදී ඔබතුමා එකඟ වුණා මන්ත්‍රීවරුන්ට ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමා කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ ලිපිය ඉදිරිපත් කරන්නේ ඩබ්ලිව්.ඒ. අජිතා ප්‍රියංගනී මහත්මිය, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ භාර ගැනීම සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පෙත්සමක් ද ඉදිරිපත් කරන්නේ?

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

පෙත්සමක් නොවෙයි. මානව හිමිකම් කොමිෂන් සභාවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෙත්සමක් ඉදිරිපත් කරනවා නම්, මට ඒ අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේක ලිපියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෙත්සමක් නම් මට අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

නැහැ, මේක ගරු ප්‍රධාන ඇමැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැත්නම් මට අවස්ථාව ලබා දෙන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Information and Trade Affairs)

ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. එතුමා ඒකට එකඟයි.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලබා දුන්නු නිර්දේශ තමයි මම එතුමාට ඉදිරිපත් කරන්නේ.

# පෙත්සම්
PETITIONS

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, කළුතර, කලමුල්ල, බප/කළු/කලමුල්ල රෝමානු කතෝලික කනිටු විදුහල, කේ.එල්.පී. රාජකරුණා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, බුලත්සිංහල, බප/හො/යටගම්පිටිය කනිෂ්ට විද්‍යාලය, ශ්‍රී ලංකා ගුරු සේවය - I ආරියදාස උදටියාවල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, කඳාන, මීගමුව පාර, අංක 88 හි පදිංචි වත්තල ප්‍රාදේශීය සභාවේ එ.ජා.ප. මන්ත්‍රී කණ්ඩායමේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මුල්ලේරියාව නව නගරය, උඩුමුල්ල, "සඳකැළුම්" **අංක** 113 හි පදිංචි ඉන්දික කුරුප්පුආරච්චි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මීරිගම, අලුක්වත්ත, නැලිගම, වේවැල්දෙනිය පාර, අංක 112/1 හි පදිංචි එන්.ඒ.කේ. විජේසිරි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

*[සභා මේසය මත තබන ලද පෙත්සම්]*
*[Tabled petitions]*

**ගරු එඩ්වඩ් ගුණසේකර**
Hon. Edwerd Gunasekara

ගරු සභාපතිතුමනි, බඩල්ගම, කෙහෙල්ඇල්ල හි පදිංචි කේ.ඇම්.ජී. මල්ලිකා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

* **[*කල් ගන්නා ලද ප්‍රශ්නය*]**
[ Adjourned Question]

## පළාත් මාර්ග සංවර්ධනය : වන්දි ලබා දීම
PROVINCIAL ROAD DEVELOPMENT : OBTAIN COMPENSATION

**01.**

**ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභ සාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/VI(1)/14/03)**

අ. පළාත් මාර්ග ගණනාවක් සංවර්ධන කිරීමේදී මාර්ග දෙපස ජනතාව වන්දි ලබා ගැනීමකින් තොරව තම

ඉඩමේ ප්‍රමාණයක් පාර සංවර්ධනයට නිදහස් කළ ස්ථාන ඇති බව පිළිගන්නේද?

ආ. එකී ස්ථානවල මාර්ගය පුළුල් කළද, විදුලි කණු, දුරකථන කණු එලෙසින්ම පවතින බව පිළිගන්නේද?

ඇ. මාර්ගය ලෙස භාවිතා වන සීමාවේ මෙම කණු පැවතීමෙන් එය අනතුරුදායක තත්ත්වයක් බව පිළිගන්නේද?

ඈ. එකී අනතුරුදායක තත්ත්වය වෙනස් කිරීමට ගන්නා වූ පියවර කවරේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

ඈ. ඉතා අනතුරුදායක ලෙස හඳුනා ගන්නා ලද ස්ථානවල ඇති විදුලි කණු හා දුරකථන කණු ප්‍රමුඛතාවය අනුව අදාළ ටෙලිකොම්/විදුලි සමාගම්වලට මුදල් ගෙවා ඉවත් කිරීමට පියවර ගන්නා ලදී.

ඉ. අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ඔබතුමා එම ස්ථාන හඳුනාගෙන තිබෙනවා නම්, පාරවල් හැටියට එවැනි ස්ථාන කීයක් වාගේ ප්‍රමාණයක් තිබෙනවාද කියන එක -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රශ්නයට මට වාචිකව පිළිතුරක් දෙන්න අමාරුයි. මේක ලිඛිතව නැවත ඉදිරිපත් කළාම මම ඒකට උත්තරයක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම අහන්නේ අමුතු ප්‍රශ්නයක් නොවෙයි. එතුමා කියනවා හඳුනාගත් ස්ථාන තිබෙනවා කියලා. මම අහන්නේ එහෙම තියෙනවා නම්, ඒ වාගේ ස්ථාන කීයක් විතර තියෙනවාද කියලයි.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ඒක තමයි. කීයක් තියෙනවාද කියලා මට එහෙම කියන්න බැහැ. මගේ අතේ දැන් එහෙම Details නැහැ නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ වාගේ ඇමැතිවරු මේ සභාව විහිළුවක් කරලා තියෙන්නේ. මොකක්ද මේ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න කෝ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අතුරු ප්‍රශ්න තමයි අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාටත් අයිතියක් තිබෙනවා, දැන් උත්තර දෙන්න බැරි නම් කල් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අතුරු ප්‍රශ්න ඇහුවාම මේ ඇමැතිවරු උත්තර දෙන්නේ නැත්නම් මොකද කරන්නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අදාළත් නැහැ. ප්‍රශ්න අහන වෙලාවේදී වාද විවාදවලට යන්න දෙන්න බැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකේම තියෙන ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්නයක් හැටියට මට අහන්න අයිතියක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

උත්තරයක් දුන්නාම නීතිය අනුව ඊට වඩා කථා කරන්න ඉඩ දෙන්න එපා සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අතුරු ප්‍රශ්න අහපු එක කලින් ප්‍රශ්නවල තියෙනවාද? ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මේ අහන්නේ කීවෙනි ප්‍රශ්නයටද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම ඇහුවේ. එතුමා කියනවා, හඳුනාගත් ස්ථාන තිබෙනවා කියලා. මම අහන්නේ, එහෙම තියෙනවා නම්, ඒවාගේ ස්ථාන පාරවල් හැටියට කීයක් තිබෙනවාද කියලා. ඕකට උත්තර දෙන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පුළුවන් නම් උත්තර දෙන්න. නැත්නම් කල් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අමුතුවෙන් කල් ගන්න දෙයක් නැහැ. මේ ප්‍රශ්නයේදී වෙන කල් ගැනීමක් බැහැ. දැන් මේ ප්‍රශ්නයට මාස හයක් විතර වෙනවා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම උත්තරයක් දුන්නා පසුව උත්තර දෙනවා කියලා. මට මෙතැන එක පාරට ඒ පාරවල් සංඛ්‍යාව කියන්න මගේ අතේ තොරතුරු නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැත්නම් කොහොමද කියන්නේ එවැනි ස්ථාන තිබෙනවා කියලා. එහෙම නැත්නම් කොහොමද කියන්නේ ස්ථාන තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට අවස්ථාවක් දෙමු ගරු මන්ත්‍රීතුමා.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ස්ථාන තිබෙන ප්‍රමාණය අහන්න. එතකොට මම ඔබතුමාට උත්තරයක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පොඩ්ඩක් ඔළුවෙන් හිට ගන්න. ඔළුවෙන් හිට ගන්න. ඔළුවෙන් හිට ගත්තාට පස්සේ ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අහනකොට අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. බොහොම කෙටියෙන් ඒ ප්‍රශ්න අහලා ඉවර කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අනවශ්‍ය ප්‍රශ්නවලට ගියේ නැහැ. මාස 06 ක් විතර ඉවසලා හිටියා.

*න්‍යාය පත්‍රයේ අංක **02** යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.*

*The question in the name of the Hon. Lakshamn Nipuna Arachchi, member, under item No. 02 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it was ordered that the question be referred to the next Council sitting.*

## ගම්පහ අධ්‍යාපන කලාපය : සාක්ෂරතාව
GAMPAHA EDUCATION ZONE : LITERACY

**03.**

**ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/47)**

අ. ගම්පහ අධ්‍යාපන කලාපයේ පළාත් සහා පාසල් ගණන කීයද?

ආ. එම පාසල්වල 2, 3, 4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ. එම පාසල් හා ශ්‍රේණිවලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. පළාත් සහා පාසල් සංඛ්‍යාව 141 කි.

| කොට්ඨාශය | 1AB | 1C | 2 වර්ගය | 3 වර්ගය | එකතුව |
|---|---|---|---|---|---|
| ගම්පහ | 4 | 7 | 19 | 15 | 45 |
| අත්තනගල්ල | 4 | 11 | 23 | 11 | 49 |
| දොම්පෙ | 2 | 12 | 17 | 16 | 47 |
| එකතුව | 10 | 30 | 59 | 42 | 141 |

ආ.

| කොට්ඨාශය | මාධ්‍යය | ශ්‍රේණිය හා ශිෂ්‍ය සංඛ්‍යාව 3 | 4 | 5 | එකතුව |
|---|---|---|---|---|---|
| ගම්පහ | සිංහල | 08 | 06 | 07 | 21 |
| අත්තනගල්ල | සිංහල | 16 | 20 | 12 | 48 |
| දොම්පෙ | සිංහල | 08 | 06 | 08 | 22 |
| එකතුව | | 32 | 32 | 27 | 91 |

ඇ. ප්‍රශ්නය, මට මේක තේරෙන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කිව්වොත් අදාළ පාසල් මට්ටමෙන් තොරතුරු දෙනවා. ඔබතුමා ඉල්ලන්නේ කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න කියලා. ඔබතුමා ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? කිව්වා නම් මට හරි පහසුයි. නැත්නම් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ එකම ප්‍රශ්නය කලාප කාර්යාලයෙන් කාර්යාලයට එන්නේ. ඔබතුමා මට පිළිතුරු දීලා තිබුණා. ඒක හරි. ඒ විධියටම මේකටත් පිළිතුරු දුන්නා නම් හරි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඇ. ගම්පහ අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික අංශයේ සාක්ෂරතාවය නොමැති සිසුන් ලෙස හඳුනාගත් සංඛ්‍යාව 91 ක් පමණ වේ. මෙම සිසුන්ට මේ ලෙස සාක්ෂරතාවය අඩු වීමට බලපාන ලද හේතු විමසීමේදී පහත සඳහන් කරුණු අනාවරණය කර ගැනීමට හැකි විය.

1. පවුල් පරිසරය ගැටළු සහිත වීම.
   උදාහරණ : දෙමාපියන් වෙන් වීම, රට යාම, නිශ්චිත භාරකරුවකු නොමැති වීම.
2. ආරමය ගති ලක්ෂණ හා අඩු සාධන හැකියාව, බුද්ධිය අඩුකම.
3. විශේෂ අවශ්‍යතා ඇති, ඉගෙනුම් දුෂ්කරතා ඇති සිසුන් වීම.

4. දෙමාපියන් තම දරුවන් කෙරෙහි ඇති නොසැලකිල්ල හා අනවබෝධය.

5. දරුවන් දිනපතා පාසල් නොපැමිණීම.

ඈ. පැන නොනගී.

## හොරණ, ඕලබොඩුව සුමංගල විද්‍යාලය : විදුහල්පති තනතුර
## HORANA OLABODUWA VIDYALAYA : POST OF PRINCIPAL

**04.**

**මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා ඊකීරක්‍ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/51)**

අ. හොරණ අධ්‍යාපන කලාපයේ ඕලබොඩුව සුමංගල මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා එම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇත්තේද? එම සුදුසුකම් සඳහන් කරන්නේද?

ආ. විදුහල්පතිවරයා සිය අත්තනෝමතික තීරණ මත පාසලේ ගුරු භවතුන් ස්ථාන මාරු කරමින් ජාතික ගුරු මාරු ප්‍රතිපත්ති, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධි විධාන කඩකර ඇති බව පිළිගන්නේද?

ඇ. මොහුට හිතවත් අතිරික්ත ගුරුවරුන් 17 දෙනෙකු පාසලේ රඳවා ගෙන ඇති බව දන්නේද?

ඈ. පාසලේ මුදල් වියදම් කිරීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂණයක් කරන්නේද?

ඉ. තම විෂයන්ට අදාළ ගුරුවරුන් වෙනත් විෂයන් ඉගැන්වීමට යෙදවීම විදුහල්පතිවරයාට හිතවත් ගුරුවරුන් රාජකාරිවලින් නිදහස් කිරීම, ප්‍රාථමික අංශයේ ගුරුවරුන් ඉහළ ශ්‍රේණිවල අධ්‍යාපන කටයුතු සඳහා යෙදවීම, ජ්‍යෙෂ්ට ගුරුවරුන් අධීක්ෂණය සඳහා නවක ගුරුවරුන් යෙදවීම ආදී පාසල් පරිපාලනයේ විවිධ අක්‍රමිකතා සිදු වන බව දන්නේද?

ඊ. ගුරු සංගමයක ලේකම් යැයි කියා ගන්නා මොහු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පවා අභිබවා යමින් ගුරුවරුන් විවිධ හිංසනයට ලක් කිරීම පිළිබඳව සුදුසු පියවරක් ගන්නේද?

උ. අධ්‍යාපන ක්ෂේත්‍රය දේශපාලනීකරණය වීමෙන් ගුරුවරුන් විවිධ අපහසුතාවලට ලක් වීම මෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වීම පිළිබඳව සුදුසු පියවර ගන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්. ශ්‍රී ලංකා විදුහල්පති සේවය 2 II

ආ. නැත.

ඇ. නැත.

ඈ. නැත. අනාවරණය වී නැත.

ඉ. නැත. වාර්තා වී නැත.

ඊ. නැත. එසේ වාර්තා වී නැත.

උ. එවැන්නක් වාර්තා වී නැත.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. මේ විද්‍යාලයේ වසර අවුරුදු 57 න් පස්සේ ගුරුවරු තුන්දෙනෙක් මාරු කරලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාට නම් කියන්න පුළුවන්ද? නම් කිව්වොත් මා ළඟ විස්තර තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, දැන් මට නම් මතක නැහැ. මම ඒ නම් තුනම ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. එතකොට මේ චක්‍රලේඛවලට පටහැනිව තමයි 57 න් පස්සේ මේ ගුරුවරු මාරු කරලා තිබෙන්නේ. ඒ වාගේම අතිරික්ත ගුරුවරු ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක ප්‍රශ්නයක් අහන්න කෝ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පළමුවැනි එක මොකක්ද කියන්න කෝ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පළමුවැනි එක අවුරුදු 57 න් පස්සේ ඔය විද්‍යාලයේ ගුරුවරු මාරු කරලා තිබෙනවා. ඒක ඔබතුමා පිළිගන්නේ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පසුගිය වසර දෙක තුළ ස්ථාන මාරුවීම් හයක් කෙරිලා තිබෙනවා. එයින් කුසුම් නාලනී ගුරුතුමිය තමන්ගේ ඉල්ලීම මත මාරු වීම ලබා ගෙන තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතකොට වසය?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

වයස නම් මට අහගන්න බැරි වුණා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඇත්තද? අහගන්න එපැයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මේ කියන්නේ, පසුගිය අවුරුදු දෙකටම ගුරුවරු හය දෙනයි මාරු වෙලා තියෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කියන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මේ ප්‍රශ්නයෙන් පස්සේ මේ කියන බොහෝ දේවල් නිවැරැදි වෙලා තිබෙනවා. ඒක මම පිළිගන්නවා. ඊළඟට මම ඔබතුමාට ලිඛිතව දැනුම් දෙන්නම් මෙන්න මේ අය මාරු කරලා තිබෙන්නේ කියලා. දැන් ඒ වාගේම -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න කෝ? එතකොට මම උත්තර දෙන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අනෙක් එක දැන් මේ විද්‍යාලයේ තාප්පවල තීන්ත ගෑම සඳහා නිපොලැක් සමාගමෙන් තීන්ත ලබා දීලා තිබෙනවා. ඒ තීන්තවලට අමතරව මුදල් එකතු කර ගෙන තිබෙනවා. ඒකේ අයවැය වාර්තා කිසි දෙයක් විද්‍යාලයට ඉදිරිපත් කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය අහන්න කෝ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි මම අහන්නේ. එහෙම අයවැය වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ පාසලේ පරීක්ෂණයක් කරලා තිබෙනවා. මුදල් අක්‍රමිකතා කිසිවක් වාර්තා වී නැත. මට දීලා තිබෙන පසුබිම් වාර්තාවේ තිබෙනවා,

ප්‍රධාන මුදල් පොත පරීක්ෂා කළෙමි. අදාළ තොරතුරු නිවැරැදිය. ප්‍රධාන මුදල් පොතේ ශේෂය 584,898.17 යි.

වැය ලෙජරයේ. අදාළ පරීක්ෂණවලදී එහෙම දෙයක් නිරාවරණය වෙලා නැහැ. ඔබතුමා දැන් ඉදිරිපත් කරනවා නම් ඒ පිළිබඳව සොයා බලා මට උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ප්‍රධාන ඇමැතිතුමා, මම මේක පැහැදිලි කරනවා නම් ගරු සභාපතිතුමනි, ආයතනයකින් තමයි තීන්ත දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මෙහෙම කරමු. ඔබතුමා ප්‍රශ්නය විතරක් යොමු කරන්න. එතුමා ඊළඟ සභාවේදී උත්තරයක් දෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්නම්.

## අන්තර් පළාත් ස්ථාන මාරු : ගුරුවරුන් බඳවා ගැනීම
INTERIM PROVINCIAL TRANSFERS : APPOINTING OF TEACHERS

**05.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/53)**

අ. i. අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ අප පළාතට ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය කුමක්ද?

ii. වෙනත් පළාත්වලින් ස්ථාන මාරු නිර්දේශ ලැබ පැමිණෙන ගුරුවරුන් මෙම වර්ෂය තුළ (2014) මෙම පළාතට බඳවා ගෙන තිබේද?

iii. එසේ බඳවා ගෙන තිබේ නම් ඒ කොපමණ සංඛ්‍යාවක්ද?

iv. එසේ බඳවා ගත් ගුරුවරුන් බඳවා ගත් පදනම කුමක්ද?

v. එසේ බඳවා ගත් ගුරු වර්ග මොනවාද? කොපමණ සංඛ්‍යාව බැගින්ද?

ආ. i. පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් ජාතික පාසල් සේවයට මුදා හරින්නේ කුමන ප්‍රතිපත්තියක් මත පිහිටාද?

ii. මෙම වර්ෂය තුළ පළාත් පාසල් සේවයෙන් ජාතික පාසල් සේවයට මුදාහල ගුරු සංඛ්‍යාවන් ඒ ඒ ගුරු වර්ගය අනුව කොපමණද?

iii. ජාතික පාසල් සේවයට පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් මුදාහරින ක්‍රමවේදය විනිවිදව හා ක්‍රමවත්ව ක්‍රියාත්මක කරන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. i. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2007.12.13 දිනැති චක්‍රලේඛ අංක 2007/20 දරන ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය.

ii. බඳවාගෙන තිබේ.

iii. 492 කි.

iv. සේවය ස්ථිර කරන ලද ගුරුවරුන් හා විනය විරෝධී කටයුතු නොමැති ගුරුවරුන්.

වැටුප් ගෙවීමට මුදල් ප්‍රතිපාදන තිබීම අනුව.

සේවා අවශ්‍යතාවය මත.

වෛද්‍ය හේතූන් මත.

ක්‍රියාන්විත රාජකාරී/අත්‍යවශ්‍ය සේවාවල රාජකාරියේ නියුතු නිලධාරීන්ගේ භාර්යාවන්.

V.

### බස්නාහිර පළාතට 2014 වර්ෂයේදී වෙනත් පළාත්වලින් බඳවා ගත් ගුරුවරු පිළිබඳ තොරුතුරු

| | සබරගමුව | මධ්‍යම | වයඹ | ඌව | උතුරු මැද | උතුර | නැගෙනහිර | දකුණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාථමික | 7 | 16 | 8 | 4 | 14 | 6 | 7 | 28 | 90 |
| කලා උපාධි | 16 | 9 | 11 | 12 | 31 | 3 | 4 | 15 | 101 |
| ඉංග්‍රීසි | 12 | 12 | 15 | 2 | 18 | 4 | 15 | 13 | 91 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 1 | 3 | 2 | 2 | 3 | - | 5 | 4 | 20 |
| විද්‍යාව | 5 | 9 | 5 | 5 | 5 | 1 | 3 | 8 | 41 |
| ගණිතය | 4 | 4 | 4 | - | 5 | - | 5 | 7 | 29 |
| නැටුම් | 2 | 3 | 1 | 1 | - | - | 3 | 2 | 12 |
| සංගීත | 2 | 3 | 3 | 2 | 2 | 1 | - | 5 | 18 |
| චිත්‍ර | - | 1 | 1 | - | 1 | - | 1 | - | 4 |
| තාක්ෂණය | - | - | 2 | 1 | - | - | - | 1 | 4 |
| වාණිජ උපාධි | 1 | 1 | - | - | 3 | - | - | 4 | 9 |
| බුද්ධ ධර්මය | 1 | - | 1 | 1 | 2 | - | 1 | - | 6 |
| ඉතිහාසය | 1 | 1 | - | - | 1 | - | - | 2 | 5 |
| ගෘහ විද්‍යාව | - | 2 | - | 2 | 2 | 1 | - | 2 | 9 |
| කලා ශිල්ප | - | 1 | 1 | - | - | - | - | 1 | 3 |
| විශේෂ අධ්‍යාපන | 1 | - | 1 | - | 1 | - | - | - | 3 |
| අධ්‍යාපනවේදී උපාධි | 2 | - | - | - | - | - | - | - | 2 |
| තොරතුරු තාක්ෂණය | - | 1 | 1 | - | 1 | - | 2 | 5 | 10 |
| පුස්තකාල | 1 | 2 | - | - | 2 | - | - | - | 5 |
| කෘෂිකර්මය | 2 | 1 | 1 | 4 | - | 1 | 1 | 1 | 11 |
| සමාජ අධ්‍යනය | - | 2 | - | - | 1 | - | - | - | 3 |
| දෙමළ | 2 | 1 | - | 2 | - | 1 | - | 1 | 7 |
| ඉස්ලාම් | - | - | - | - | - | - | - | 1 | 1 |
| රෝමානු කතෝලික | 1 | - | 1 | - | 1 | - | - | - | 3 |
| හින්දු | - | 1 | - | - | - | - | - | - | 1 |
| සමෘද්ධි ගුරු | - | 4 | - | - | - | - | - | - | 4 |
| | 61 | 77 | 58 | 38 | 93 | 18 | 47 | 100 | 492 |

ආ. i. බස්නාහිර පළාත තුළ වර්ෂ 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ ගුරුභවතුන්.

ii. 55 යි.

**2014 වර්ෂයේදී ජාතික පාසල් සේවය වෙත නිදහස් කර ඇති ගුරුභවතුන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | විෂය | ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කලා උපාධි | 24 |
| 2. | වාණිජ උපාධි | 05 |
| 3. | ඉංග්‍රීසි | 07 |
| 4. | ලලිත කලා උපාධි | 04 |
| 5. | විද්‍යාව | 05 |
| 6. | ගණිතය | 03 |
| 7. | නාට්‍ය හා රංග කලාව | 01 |
| 8. | ප්‍රාථමික | 05 |
| 9. | නර්තනය | 01 |
| | එකතුව | 55 |

iii. ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය. ඔබතුමා සඳහන් කළා, 2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව පළාතට ගුරුවරු බඳවා ගන්නවා කියලා. නමුත් මේ වනවිට ගුරුවරු විශාල ප්‍රමාණයක් දුෂ්කර සේවය කරලා මේ පළාතට එන්න බැරුව ඉන්නවා. එතකොට ඔබතුමා මේ කියන ප්‍රතිපත්තියට අනුව ඔවුන්ව පළාතට බඳවා ගන්න කටයුතු කරනවාද කියන එක මම දැනගන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකේ පැහැදිලිව අපි කිව්වා, ඒ බඳවා ගැනීම්වලදී - ඔබතුමාට මේ ලේඛනයේ පේනවා. අපි වැඩිපුරම බඳවා ගන්න කටයුතු කරලා තිබෙන්නේ ප්‍රාථමික ගුරුවරුන්. මොකද, බස්නාහිර පළාතේ පුහුණු ප්‍රාථමික

ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ නිසා ප්‍රාථමික ගුරුවරුන්ට ප්‍රමුඛතාවයක් දෙනවා. ඒ වාගේම ඉංග්‍රීසි ගුරුවරු. ඒ වාගේම සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන ගුරුවරු. විද්‍යාව, ගණිතය විෂයයන්වලට අදාළව. ඒ වාගේ අපට ප්‍රධාන පුරප්පාඩු තිබෙන විෂයයන්වලට ප්‍රමුඛතාවයක් දෙනවා ගරු මන්ත්‍රීතුමා. කලා උපාධි වාගේ විෂයන් සඳහා අපේ පළාතේ පුරප්පාඩු නැති වුණාම අපි ඒවාට උනන්දු කරන්නේ නැහැ මේ පැත්තට එන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. මේ බඳවා ගැනීම්වලදී පිට පළාත්වලින් එන අය - ඔබතුමා දන්නවා, විශේෂයෙන්ම පිට පළාත්වලත් ඉතා දුෂ්කර පාසල්වල තමයි ඔවුන් සේවය කරන්නේ. උදාහරණයක් විධියට අනුරාධපුර, පොළොන්නරුව හෝ වෙනත් දිස්ත්‍රික්කයක ඔවුන් සේවය කරද්දී දුෂ්කර පාසල්වල තමයි සේවය කරන්නේ. නමුත් දැන් නිරන්තරයෙන් අපට ලැබෙන පැමිණිලි තමයි බස්නාහිර පළාතට ආවම ඔවුන් නැවත වතාවක් දුෂ්කර පාසල්වලට තමයි අනුයුක්ත කරන්නේ. උදාහරණයක් විධියට ගම්පහට ආවොත් ඔවුන් මීගමුවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් අහන්න. දුෂ්කර පළාත්වල සේවය කළ ගුරුවරුන්ට නැවත ලැබෙන්නේ දුෂ්කර පළාත්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. අන්න හරි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා අහන එක මම පිළිගන්නවා ගරු සභාපතිතුමනි. ගැටළුව තිබෙන්නේ, ගම්පහ කලාපය තුළ පුරප්පාඩු තිබෙනවා නම්, අපි ඒ අයට අවස්ථාව දෙනවා. එහෙම නැත්නම් අපි ඒ අයට කියනවා, මෙතැනට යන්න. පස්සේ ඒ අයට ප්‍රමුඛතාවයක් දෙනවා කියලා. දැන් ඔබතුමා දන්නවා, වෘත්තීය සමිති නියෝජිතයෙක් හැටියට කටයුතු කරන කොට සියලු වෘත්තීය සමිති ගෙනැල්ලා කලාප මාරුවලට අපි ක්‍රමවේදයක් හැදුවා. ලකුණු දෙන ක්‍රමවේදයක්. ඒක 2015 ඉඳලා ක්‍රියාත්මක කරනවා ගරු සභාපතිතුමනි. එතකොට කාටවත් බලපෑම් කරන්න බැහැ. දුෂ්කර සේවයට සහ ඒ සේවාවන් අනුව ලකුණු දෙන ක්‍රමවේදය තුළ ප්‍රමුඛතාවයක් දෙනවා. මෙතෙක් කල් එවැනි ක්‍රමවේදයක් තිබුණේ නැහැ. සියලු වෘත්තීය සමිති සාකච්ඡා කරලා අපි ක්‍රමවේදය හඳුනාගෙන - අපට දෙසැම්බර් මාසේ ක්‍රියාත්මක කරන්න වෙන්නේ නැහැ. නමුත් ජනවාරි මාසයේ ඉඳලා ඒක ක්‍රියාත්මක කරනවා ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟ අතුරු ප්‍රශ්නය. පළාත් පාසල්වලින් ජාතික පාසල්වලට යැමේදී ඔබ විසින් යම්කිසි - ඒ කියන්නේ, ඔවුන් නතර කිරීමක් හෝ තහනමක් සිදු කරලා තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. අපි ජාතික පාසල්වලට ගුරුවරු නිදහස් කිරීම තාවකාලිකව නතර කරලා තිබෙනවා. ප්‍රධාන හේතුව අපට ඉන්න හොඳම ගුරුවරු, හොඳ අත්දැකීම් තිබෙන ගුරුවරු ජාතික පාසල්වලට ගියාම අපේ පාසල්වල දරුවන්ට යම් අගතියක් සිද්ධ වෙනවා. ඒ නිසා අපි තාවකාලිකව නවත්වලා තිබෙනවා. නමුත් අපට අතිරික්තයක් තිබෙනවා. ගුරුවරුන් අපි නිදහස් කරනවා. ඒ වාගේම මානසික ආතතිය තිබෙන ගුරුවරු එහෙම ඉල්ලීම් කළොත්, අපි ඒ අයවත් නිදහස් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තූතියි.

***න්‍යාය පත්‍රයේ අංක 06 සහ 07 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයද,***

***න්‍යාය පත්‍රයේ අංක 08 යටතේ අනුරුද්ධ ලේකම්ගේ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයද,***

***න්‍යාය පත්‍රයේ අංක 09 යටතේ කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයද,***

***න්‍යාය පත්‍රයේ අංක 10 යටතේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයද,***

***ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, එකී ප්‍රශ්න සඳහා සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon. Mahinda Jayasinghe, member, under item No. 06 and 07,*

*The question in the name of the Hon. Anuruddha Lekamge, member, under item No. 08,*

*The question in the name of the Hon. K.D. Aruna Deepal, member, under item No. 09,*

*The question in the name of the Hon. Mujibur Rahuman, member, under item No. 10,*

*of the agenda, were presented to the Hon. Chief Minister and as two weeks time was asked for, it was ordered that the questions be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 11 යටතේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of the Hon.Manju Sri Arangala, Hon Opposition Leader, under item No. 11 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it, was ordered that the question be referred to the next Council sitting.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අංක 07 ට අදාළව පොඩි කාරණයක් පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. එතුමා කල් ඉල්ලුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා කල් ඉල්ලුවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ පාසලේ යම්කිසි ගැටළුකාරී තත්ත්වයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ප්‍රශ්න අංක 07 ට අදාළව ගරු ප්‍රධාන අමාත්‍යතුමා කල් ඉල්ලුවා. කමක් නැහැ. මට පසුව උත්තර දෙන්න. මම අවධානය යොමු කරන්නේ -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකක්ද ප්‍රශ්නය මන්ත්‍රීතුමා?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න අංක 07. මහරගම විද්‍යාකර බාලිකාවේ ප්‍රශ්නය සම්බන්ධයෙන්. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, නියෝජ්‍ය විදුහල්පතිවරු තිදෙනෙක් සහ එක ගුරුවරියක් පළාත් ලේකම්තුමාට සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යොමු කළ ලිපි තුනක් මා සතුව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ ලිපි ටික සභාගත කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මොකක්ද ඒ? ප්‍රකාශයක්ද කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ප්‍රකාශයක් නොවෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ ප්‍රකාශයක් නොවෙයි. කලබල වෙන්න එපා. පොඩ්ඩක් ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට අවස්ථාව දුන්නේ වැදගත් ප්‍රශ්නයක් වූ නිසා. දැන් ඒක කෙටියෙන් අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විද්‍යාකර බාලිකාවේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා කලබල වෙන්නේ ඇයි කියලාත් අපි දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව දුන්නාට පස්සේ විවාදවලට යනවා නේ? ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හොරාට කලින් කෙසෙල් කැන වැට පැන්නාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. මට අද මේ සභාවේ න්‍යාය පත්‍රයට යන්න ඕනෑ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මේ ලිපි තුන සභාගත කරනවා.[1]

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

සභා රීති කඩන්නේ නැතුව වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හොරාට කලින් කෙසෙල් කැන වැට පනින්නේ නැතුව පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මූලාසනයේ අසුන් ගන්න මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජ්‍යෙෂ්ට මන්ත්‍රී කෙනෙක්. හිටපු ඇමැති කෙනෙක් නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ ප්‍රශ්නය මම බේරා ගන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට කැක්කුමක් තියෙනවා කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට කාලය දුන්නා නේ? සභාගත කරන්න. දැන් නවත්වන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම ඉල්ලන්නේ කරුණාකරලා මේ සම්බන්ධයෙන් යම් විමර්ශනයක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක බලලා කරයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ගියවර සභාවේදී මම කල් තබන අවස්ථාවේදී ප්‍රශ්නයක් යොමු කළා. ඒකට සම්පූර්ණ උත්තරය ලැබුණේ නැහැ. මොකද, විෂයය භාර ඇමැතිතුමා හිටපු නැති නිසා. මට ඒ වෙලාවේ පොරොන්දු වුණා, මේ ප්‍රශ්නය සම්බන්ධව අතුරු ප්‍රශ්නවලට උත්තර අද දෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය ඇමැතිතුමාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සෞඛ්‍ය ඇමැතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කල් තබන අවස්ථාවේ එදා ඔබතුමාට ප්‍රශ්නයක් යොමු කළා. ඔබතුමා සභාවේ හිටියේ නැහැ. ඔබතුමා හදිසි වැඩ සටහනකට සම්බන්ධ වුණා. ඔබතුමාට දැන් උත්තර දෙන්න අපහසු නම් ඒ සම්බන්ධයෙන් කල් ගන්න.

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ඒ සභාගත කරන ලද පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙනවාද ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, හෝමාගම රෝහලේ නව ගොඩනැගිල්ලට ලෙඩ්ඩුන් බලන්නට යන හැම දෙනාම සපත්තු සෙරෙප්පු ගලවලා යන්න ඕනෑ කියන ප්‍රශ්නයත් එක්ක ඔබතුමා උත්තරයක් දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි ගරු මන්ත්‍රීතුමා. මට මතකයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාපට් එක සවුත්තු වන නිසා තමයි ඒ ගොඩනැගිල්ලට එහෙම තීරණයක් ගත්තේ කියලා. දැන් ඒකෙන් අතුරු ප්‍රශ්නය හැටියට එන්නේ ගරු ඇමැතිතුමනි, එකක් තමයි දැන් අපි කියමු දියවැඩියාව වාගේ රෝගීන් යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කාලය දෙන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමාට කාලය නොදී ඉන්න බැහැ. මොකද, මට කිව්වා අද අවස්ථාව දෙනවා කියලා අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමා දිගින් දිගටම ප්‍රශ්නය ආපහු කියන්න අවශ්‍ය නැහැ. ගරු ඇමැතිතුමා උත්තරයක් දෙයි. පොඩ්ඩක් ඉන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතුමා මේ ප්‍රශ්නය දන්නවා. සෞඛ්‍ය සම්බන්ධ ප්‍රශ්නයටත්, ඒ වාගේම සපත්තු සෙරෙප්පු නැතිවීම සම්බන්ධවත් ඔබතුමා ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට සමාවෙන්න ඕනෑ. මේ මොහොතේ මට විධිමත් උත්තරයක් දෙන්න බැහැ. හැබැයි, ගරු මන්ත්‍රීතුමා කැමැති නම් කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒකට එකඟද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි මම අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, මට දිගින් දිගටම විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විධිමත් උත්තරයක් අවශ්‍ය නම් මට කල් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගට විවාදවලට යන්න දෙන්න බැහැ. ඔබතුමා එකඟද? එතුමා ලැහැස්තියි පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ සභා වාරයේදී උත්තර දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට එනවාද? ආපහු මට ඊළඟ දවසේත් මේ ප්‍රශ්නය මතු වෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒක සභා කටයුතු කාරක සභාවේ වගකීම. එතුමා එවනවා නම් මම කැමැතියි උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලබන සභාවේදී ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතුමාට කෙටියෙන් පිළිතුරු දෙන්න කියන්න කෝ ගරු සභාපතිතුමා. එතුමාට කෙටියෙන් දෙන්න පුළුවන්නේ නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ අවසරය මත කැමැති නම් මගෙන් ඒ ප්‍රශ්න ටික ඇහුවොත් මට දැනට තිබෙන සමාජ අවබෝධය මත උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පැහැදිලිව කරුණු සොයාගෙන උත්තරයක් දෙන්න කෝ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

රීතියක් තිබෙනවා. ඒක තමයි එතුමාට යොමු කරන්නේ. ඒ නිසා මට ඊළඟ සභාවට කල් දෙන්න. ඔබතුමාත් එකඟයි. මාත් එකඟයි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි මේ අවස්ථාවේදී මතක් කරන්නේ, ජනාධිපති මැතිවරණයක් තව නුදුරේදීම පැවැත්වෙනවාය කියන ආරංචියත් එක්ක පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට මේ ඊයේ පෙරෙයිදා යතුරු පැදි බෙදා දීමක් සිදු කළා. අපි දන්නා පරිදි මේ යතුරු පැදියක වෙළඳ වටිනාකම තිබුණේ දෙලක්ෂ එක් දහස් හතළියයි. අද බයිසිකලය දෙලක්ෂ එකොළොස් දාහක් දක්වා වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒක රුපියල් දහ දහස් දෙසිය පනහකින් බයිසිකලයේ මිල වැඩි කරලා තමයි මේ මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙන්නේ. එකක්, මේක මන්ත්‍රීවරුන්ට දෙන්නේ දිවි නැගුම අමාත්‍යාංශයේ, දිවි නැගුම දෙපාර්තමේන්තුව හරහා. ඒ වාගේම වාරික 17 කින් මේ මුදල් කපා ගැනීමේ පදනම මත. රු. 50,000/- ක්. අපි කියන්නේ පළාත් පාලන ආයතනවල ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඉන්නවා. පළාත් සභා අමාත්‍යාංශය යටතේ මේ නම් ලැයිස්තු ගත කරලා, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා මේ වැඩේ කරන කොට ඒක විපක්ෂයේ ඉන්න පළාත් පාලන මන්ත්‍රීවරුන්ට මේ වරප්‍රසාදය සම්පූර්ණයෙන්ම අහිමි කරලා තිබෙනවා. ඒ නිසා අපි මතක් කරන්නේ, මේවා මැද මුලනෙන් ගේන සල්ලි නොවෙයි. මේක වෙනත් දේවල්වලින් දෙන සල්ලි නොවෙයි. මේවා මේ රටේ මහජන සල්ලි. මේවා එහෙම නැත්නම් කේ.පී. ගේ - මේ ආණ්ඩුව මේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නේ කේ.පී. ගේ සල්ලි ද? නැහැ. මේවා මහජන සල්ලි. ඒ නිසා අපි මතක් කරන්නේ, මේ විපක්ෂයේ ඉන්න අනික් හැම මන්ත්‍රීවරයකුටම මේ මුදල් ලැබෙන්නට ඕනෑ. මේ යතුරු පැදි ලැබෙන්නට ඕනෑ. ඒ නිසා ජනාධිපති මැතිවරණයක් ළඟ තියා ගෙන මේ අලුගුත්තේරු, කුපාඩි වැඩේ සම්පූර්ණයෙන්ම නවත්වන්න.

[සභාවේ ඝෝෂා]

කියන එක මතක් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා සදාචාරාත්මකව කථා කරන්න. තව පුංචි කාලයක් තිබෙන්නේ. විනාඩියක කාලයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සම්පූර්ණයෙන්ම අල්ලස් දෙනවා. ඒ නිසා අද මේ රටේ ඉතාම වැරදි දේශපාලන චිත්‍රයක් මවමින් යන්නේ. ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම දෙයක් ගරු මන්ත්‍රීතුමා. දැන් ඔබතුමා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අල්ලස් ඕගොල්ලන්ගේ අයට දුන්නොත් හොඳයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ මහජන මන්ත්‍රීවරුන්ටත් බයිසිකල් දෙන්න කියලා නේ කියන්නේ. ඔබතුමා මාතෘකාවෙන් පිට යන්න එපා. මේ වෙන වෙන ඒවා නේ කථා කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කියන්නේ, අනෙකුත් නියෝජිතයෝ - කොයි පක්ෂයේ වුණත් එකයි. මේ හැම දෙනෙකුටම එක හා සමානව දෙන්නට ඕනෑ. (බාධා කිරීම්) ඒ නිසා ආණ්ඩුවේ කියලා එහෙම දෙන්න පුළුවන්කමක් නැහැ. මැදමුලනේ සල්ලි නොවෙයි. ඒවා මහජන මුදල්. (බාධා කිරීම්) අපි කියන්නේ දෙන දේ - පළාත් පාලන නියෝජිතයෝ අද ගම්වල ඉතාම අමාරුවෙන් වැඩ කරන පිරිසක්. කොයි දේශපාලන පක්ෂයේ වුණත්. පළාත් පාලන නියෝජිතයෝ තමයි ග්‍රාමීය මට්ටමේ දේශපාලනයේ ක්‍රියාකාරී පුද්ගලයන් බවට පත් වෙන්නේ. ඒ නිසා පඩි වැඩි කළ එක අපි පිළිගන්නවා. එහෙම නම් ඇයි? අනික් දේත් දෙන්න බැරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ කුපාඩි වැඩේ අද උතුරු නැගෙනහිර පළාත් සභාවට කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ වරප්‍රසාද දෙන්නේ නැහැ. ඒ නිසා අපි මතක් කරන්නේ අද සම්පූර්ණයෙන්ම පාරිසරික ප්‍රඥප්තිය අමු අමුවේ උල්ලංඝනය කරලා පොලීසි ඉස්සරහා බැනර් දාගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකුතමා, කථාව අවසන්කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ජනාධිපතිවරණය පොලීසියත් එක්ක කරන මැතිවරණයක් බවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාව අඩු කරන්නේ නැත්නම් මට සිද්ධ වෙනවා, විපක්ෂයේ කාලයෙන් අඩු කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා අපි කියන්නේ, මේවා අලුගුත්තේරු කුපාඩි වැඩ. මේවා කරන්න එපා. (බාධා කිරීමක්) එකේ ගෞරවය ආරක්ෂා කරන්න කියලා අපි තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36 (1) –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා ඉස්සෙල්ලාම නැගිට්ටේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමාගේ කථාවට මම හොඳට සවන් දුන්නා. මට එතුමාගේ කථාවේ පොඩි අපැහැදිලිතාවයක් තිබෙනවා. මොකද, මම මන්ත්‍රීවරයෙක් හැටියට මට අයිතියක් තිබෙනවා - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මගේ අයිතියක් තමයි ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ -

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

36(1) කොහේද මේ තියෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට කෙටියෙන් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, 36(1) යටතේ. අපේ පළාත් සභාවේ අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමාට ලැබුණු වරප්‍රසාදය මේ ආණ්ඩු පක්ෂයේ අයටත් ලැබුණාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ඒක ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට අහන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

විශේෂයෙන්ම මම ගරු මන්ත්‍රීතුමන්ලාට පැහැදිලි කිරීමක් කරන්නේ. (බාධා කිරීම්) මේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කාලය විනාඩි 30 යි තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයට විනාඩි 17 කුත්, විපක්ෂයට විනාඩි 13 කුත් කාලය ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කාලය වැඩිපුර ගන්නවා නම්, කථිකයෝ අයින් කරන්න මට සිද්ධ වෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමාට මම බොහොම ගෞරවයෙන් කියන්නේ. එතුමාට මම විනාඩි 04 ක කාලයක් ලබා දුන්නා. නමුත් එතුමා විනාඩි 06 ක් කථා කළා. ඒ නිසා මට විපක්ෂයෙන් අඩු කරන්න සිද්ධ වෙනවා. (බාධා කිරීම්)

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කොඩිකාර ඇමතිතුමා හැම වෙලාවේම බාධා කරන කොට අපේ වෙලාව අඩු වෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

කොඩිකාර ඇමතිතුමා කැලණියෙත් කටවුට් ගහලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිදහස තිබෙනවා. ඕනෑ තැනක කටවුට් ගහන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. මම ඉතා කාරුණිකව. ජෝර්ජ් පෙරේරා මැතිතුමා පොඞ්ඩක් ඉන්න කෝ. (බාධා කිරීම්) මට න්‍යාය පත්‍රයට යන්න දෙන්න.

මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ අදාළ මාතෘකාවට කථා කරන්න. ඒ එක්කම නියමිත වේලාව දැනුම් දුන්නාට පස්සේ කථාව අවසන් කරන්න. කථාව දිග්ගස්සන්න එපා. එහෙම වුණොත් අනෙක් මන්ත්‍රීවරුන්ගෙන් කාලය අඩු කරන්න මට සිද්ධ වෙනවා. පැහැදිලිවම අඩු කරනවා. නැතුව මට හැමදාම මේක කරන්න බැහැ. විනාඩි 04 යි කියලා විනාඩි 06 ක් කථා කරනවා. විනාඩි 03 ක් දුන්නාම විනාඩි 05 ක් කථා කරනවා. ඒ නිසා අනික් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා. මීළඟට ගරු සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 03 ක් තිබෙනවා. විනාඩි 03 න් කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ පවතින මැතිවරණ ක්‍රමය තුළ අපි දන්නවා, ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල රටේ ජනතාවට එහෙම නැත්නම් ඡන්ද දායකයාට හිතු මනාපයට ඒවායේ නියෝජනය කරන්න බැහැ. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපි දන්නවා, මැතිවරණයකින් තමන්ට කැමැති නියෝජිතයා පත් කර ගන්නේ තමන් දරන ආකල්ප, මතවාද සහ විශ්වාසයන් පදනම් කර ගෙන බව. විශේෂයෙන් අදාළ නියෝජිතයන් හරහා තමන්ගේ බලාපොරොත්තු ඉෂ්ට කර ගැනීම සඳහා ඒ කටයුතු කර ගන්න. ඇත්ත වශයෙන්ම මෙහෙම ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවලට පත් වෙලා, එහෙම නැත්නම් උදාහරණයක් හැටියට පළාත් සභාවලට, ප්‍රාදේශීය සභාවලට, එහෙම නැත්නම් පළාත් පාලන ආයතනවලට හෝ පාර්ලිමේන්තුවට පත් වෙලා යන මේ අය තමන්ට ඡන්දය දුන් ඒ ජනතාවගේ අවශ්‍යතා, මතවාද, විශ්වාසයන් සහ කැමැත්ත අනුව කටයුතු කරන්න බැඳිලා ඉන්නවාය කියන එක අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. ඒ නිසා එහෙම පත් වන නියෝජිතයින් තමන්ගේ ඡන්දදායකයා බලාපොරොත්තු වන ඉලක්කය කරා යන්න කටයුතු කිරීම ඇත්ත වශයෙන්ම සදාචාරාත්මක වශයෙන් කළ යුතු දෙයක්. නමුත් අපි දකිනවා. අපේ රටේ පවතින ක්‍රමය තුළ ඇතැම් වෙලාවට අවංක ඡන්ද දායකයාව නියෝජනය වෙන්නේ නැහැ. ඔවුන්ගේ බලාපොරොත්තු කඩ වෙනවා. ඉතින් යම් දේශපාලන පක්ෂයකට ඡන්දය දෙන්නේ, තමන් ඒ දේශපාලන පක්ෂයේ මතවාදයන්, විශ්වාසයන් හා ඒ වාගේම ඒ ප්‍රතිපත්ති පිළිගන්නා නිසයි.

ගරු සභාපතිතුමනි, අපි කථා කළොත් අපි නියෝජනය කරන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඒ පක්ෂයේ නායකයන්, ඒ වාගේම ඒ පක්ෂයේ ප්‍රතිපත්ති, විශ්වාසයන්, ඒ වාගේම ජනතාව ඉදිරියේ තබන ඔවුන්ගේ මතවාදයත් එක්ක තමයි ඡන්දය දීම කරන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා රටේ පැන නගිමින් පවතින ක්‍රියාත්මක වන ක්‍රමය ගැන අපට යම් මතවාදීමය ගැටුමක් තිබෙනවා. අපි දන්නවා, ඇතමුන් පෞද්ගලික වාසි මුල් කර ගෙන, තමන්ට ලැබෙන වරප්‍රසාද, වරදාන ගැන හිතලා, තමන්ට ඡන්දය දුන් ජනතාවගේ ඒ විශ්වාසයන්, මතවාදයන් සහ බලාපොරොත්තු කඩ කරමින් කටයුතු කරන අවස්ථා අපට පසුගිය කාලයේ දකින්නට ලැබුණා. ඉතින් ඒ නිසා අපි කල්පනා කරන්නේ, ඡන්ද දායකයාගේ ඒ ඡන්ද අයිතිය, ඒ වාගේම ඔවුන්ගේ බලාපොරොත්තු පාවා දීමක් හැටියටයි. ඉතින් අපි මේ ගැන යළි යළිත් අවධානය යොමු කළ යුතුයි. මම මේ සභාවේදී විශේෂයෙන්ම මතු කරලා පෙන්වන්න බලාපොරොත්තු වුණේ ගරු සභාපතිතුමනි, මෙහෙම ඡන්දය පාවා දෙන, ජනතාව නොමග යවන, ඒ වාගේම ජනතාවගේ ඡන්දය අරන් ඔවුන්ගේ බලාපොරොත්තු කඩ කරන නියෝජිතයන් පිළිබඳව අපි පක්ෂ නායකයන්ගේ සහ සියලු දෙනාගේ අවධානය යොමු විය යුතුයි කියලා. මම එය මේ සභාවේදී මතක් කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අද විශේෂයෙන්ම බස්නාහිර පළාතේ පාසල් තුළ විශාල වශයෙන්ම පරිපාලනය හා පාසල්වල විනය කඩා වැටීමක් තිබෙනවා. අද මේ පාසල් දේශපාලනකරණයට ලක් වෙලත් තිබෙනවා. අපි දැක්කා, පසුගිය සුමානයේ පුවත්පත්වල විශේෂයෙන්ම අ.පො.ස. (සා.පෙළ) ප්‍රශ්න පත්‍ර පිට වීම පිළිබඳ ප්‍රශ්නයක් අද පැන නැගිලා තිබෙනවා. ඊළඟට ගිය අවුරුද්දේ පිළියන්දල කලාපයේ ප්‍රශ්න පත්‍ර පිට වුණු බව අපි දැන ගත්තා. නමුත් ඒ සම්බන්ධව අපේ අධ්‍යාපන ඇමතිතුමා, මහ ඇමතිතුමා ගත් ක්‍රියාමාර්ග ගැන අපි දන්නේ නැහැ. පසුගිය අවුරුද්දේ පිළියන්දල කලාපයේ ප්‍රශ්න පත්‍ර නිකුත් වීම සම්බන්ධව ඔබතුමා ගත් ක්‍රියාමාර්ග අපව දැනුවත් කරලා නැහැ. මම හිතන්නේ, ඒ පිළිබඳව අපට දැන ගන්නත් අයිතියක් තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැන් ජනාධිපති මැතිවරණය ළං වෙලා තිබෙනවා. ඉතින් මේ ජනාධිපති මැතිවරණයත් එක්ක මේ පාසල්වල තදින් දේශපාලනය ක්‍රියාත්මක වන බව මම කියන්න ඕනෑ. අද වන කොට මේ පාසල්වලට පළාත් සභාවේ අපේ මහ ඇමතිතුමා තමුන්නාන්සේලාගේ අරමුදල්වලින් තීන්ත ලබා දෙනවා, ගොඩනැගිලිවල තීන්ත ආලේප කරන්න. එතකොට ඒ තීන්ත ආලේප කිරීම තුළ ඒ තීන්ත ලබා දෙන්න පාසල්වලට නියෝග කරලා තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් සහභාගී විය යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි, එළියේද බැනර් දාන්න ඕනෑය කියලා නියෝග කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ තීන්ත ලබා දෙන මන්ත්‍රීවරු මේ පාසල්වලට ගිහිල්ලා දෙමව්පියන් කැඳවලා දෙමව්පියන්ට කියනවා, ජනාධිපතිතුමාට ඡන්දය දෙන්නය කියලා. ඉතාමත්ම ලැජ්ජයි. මේ ආණ්ඩුව, මේ දේශපාලනය කරන්න එපා. මේ අපරාධය කරන්න එපා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට කියලා තිබෙන්නේ අඩුපාඩු සම්බන්ධයෙන් කියලා. ඔබතුමා සඳහන් කරලා තිබෙන්නේ, -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒක අඩුපාඩුවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තීන්ත ගාන එක අඩුපාඩුවක් නොවෙයි නේ? තීන්ත ගාන එක හොඳ වැඩක් නේ?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේ පාසල්වල දේශපාලනය කරන්න එපා. අද වන කොට මේ කොළඹ නගරය තුළ තිබෙන සමහර පාසල්වල වාර විභාගය ළං වෙලා තිබෙනවා. ඒ විභාගයට උගන්වන්නේ නැහැ. අද ළමයින්ගෙන් 2000, 3000 සල්ලි එකතු කරලා උත්සව පවත්වනවා. පවත්වලා, දැන් ළමයින්ට උගන්වන්න හවස් වරුවේ පන්ති තියනවා. එහෙම අද පළාත් සභා පාසල්වලට ඉඩ දීලා තිබෙනවා. ඒක කරන්න. මම හිතන්නේ මහ ඇමතිතුමා ඒවා දන්නවා. (බාධා කිරීම්) ඒ විතරක් නොවෙයි, හැම පාසලක්ම දෙමව්පියන්ගෙන් පළමු වන වසරට අද මුදල් අය කරනවා. දෙමව්පියන්ට බලපෑම් කරනවා, මුදල් ගෙවන්නය කියලා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, 6 වසර සිට 11 වසර දක්වා දෙවැනි භාෂාව හැටියට සිංහල භාෂාව හා දෙමළ භාෂාව අනිවාර්යය කරලා තිබෙනවා. මම දන්නේ නැහැ ඔබතුමා දන්නවාද කියලා. පළාත් අධ්‍යාපන කාර්යාලයෙන් ඒ දෙවන භාෂාව සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන්නේ නැහැ. ඒවා පාසල්වලට භාර දීලා තිබෙනවා. එහෙම නම් සිංහල භාෂාව, දෙමළ භාෂාව අනිවාර්ය විෂයයක් හැටියට ආණ්ඩුව නම් කරලා තිබෙද්දීත් පළාත් අධ්‍යාපන කාර්යාලය ඒ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන්නේ නැහැ. සමහර පාසල්වල විදුහල්පතිවරු මේවා වෙළඳාමක් හැටියට අද පත් කර ගෙන තිබෙනවා. මේ ප්‍රශ්න පත්‍ර අද මුද්‍රණය කර විකුණනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ, මේ පාසල් දේශපාලනීකරණය කරන්න එපා. පාසලට දේශපාලනය ගේන්න එපා. මේක ලොකු අපරාධයක්. තමුන්නාන්සේලා බලාපොරොත්තු වන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අවසාන වශයෙන් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන විනය ගරුක සමාජය, ශිෂ්ට සමාජය සුභ අනාගතය ඒ කිසි දෙයක් වෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අසුභ අනාගතයක පෙර නිමිති පහළ වෙලා තිබෙනවාය කියන එක මතක තියාගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද, දැන් මෙතැන මාධ්‍ය ඉන්නවා. නැත්නම් එතුමාගේ කථාවට මාධ්‍ය වැරදි අර්ථකථනයක් දෙන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, “අපේ පාසල අපේ දෑතින් සුරකිමු” කියන වැඩ සටහන ජනාධිපතිවරණය ඉලක්ක කර ගෙන ආරම්භ කරපු එකක් නොවෙයි. මේක පසුගිය අවුරුදු හතරක කාල සීමාව තුළ අපි සෑම පාසලකම ක්‍රියාත්මක කරපු වැඩ සටහනක්. මම දන්නේ නැහැ එතුමා මේ වැඩ සටහනට විරුද්ධ ද කියලා. පාසලට ප්‍රතිපාදන දෙනවාට.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මට හැඟුනේ ඒ වාගේ දෙයක්. ඒ වාගේම මේ වැඩ සටහන ඉතාමත්ම සැලසුම් සහගතව පාසල් තුළ ක්‍රියාත්මක කළා. අපේ මන්ත්‍රීවරු නිරීක්ෂණ මට්ටමෙන් හැම පාසලකටමත් ගියා. එතැනදී ගරු සභාපතිතුමනි, කාරණා කිහිපයක් ඒ පාසලේ ඒ වැඩ සටහනත් එක්ක ක්‍රියාත්මක වුණා. පළමු වැනි එක, පසුගිය වර්ෂවල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම. මම ඔබතුමා හරහා මේ ගරු මන්ත්‍රීතුමා දැනුවත් කරන්න ඕනෑ. පහේ ශිෂ්‍යත්ව ප්‍රතිඵලවලින් මුල් 100 න් 40 ක් බස්නාහිර පළාතේ. 40% ක් බස්නාහිර පළාතේ. මේක පසුගිය වර්ෂයට වඩා වැඩි වෙනසක් ලබා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒකේ ගෞරවය විදුහල්පතිවරුන්ට හා ගුරුවරුන්ට ලැබෙන්නට ඕනෑ. දෙවැනි කාරණාව. අපි එතැනදී කළේ, පහේ ශිෂ්‍යත්වය සමත් ඒ දරුවන්ට සහතික පත් ප්‍රදානය කිරීමක්. ඒ වැඩ සටහනේදී එය සිදු කෙරුණා. දරුවන්ව ඇගයීම කරපු එක ඔබතුමා විරුද්ධයි ද කියන එක මට ගැටළුවක්. එතැනදී ඒ කාරණාව සිද්ධ වුණා ගරු සභාපතිතුමනි. තුන්වැනි එක, ඒ වැඩ සටහනේදී ප්‍රාථමික ගුරු පුහුණුව ලබපු ගුරුවරුන්ට ඒ ගුරු සහතික පත්‍ර ප්‍රදානය එතැනදී සිද්ධ කළා. ඒ විතරක් නොවෙයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු මහ ඇමතිතුමා, ඔබතුමා කියන දේ හරි. අපි විරුද්ධ නැහැ. අවසානයේදී දෙමව්පියන්ට අඬගහලා ජනාධිපතිතුමාට ඡන්දය දෙන්න කියලා කියනවා නේ. ඒකයි මම මතු කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. පොඩ්ඩක් ඉන්න කෝ. දැන් ඔබතුමාගේ කථාව මම අහගෙන හිටියා නේ? කට වහගෙන වාඩි වෙන්න පොඩ්ඩක්. මම කියන දේත් අහගෙන ඉන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අහගෙන ඉන්න. අමාරුයි තමයි. අමාරුවෙන් හරි අහගෙන ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමා කියපු කථාවෙන් මේ මාධ්‍යට වැරදි කථාවක් යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ ඒකේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කාරණා තුනට අමතරව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. මේක යහපත් ක්‍රියාවක් තමයි. මේ සිද්ධ වෙලා තිබෙන, ඇත්තටම මේක දේශපාලන රැස්වීමක් කර ගන්න යාම තුළ තමයි මේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විෂය භාර ඇමතිවරයා වශයෙන් කථා කරන්නේ. ඔබතුමාගේ අදාළ ප්‍රශ්නයට පැහැදිලි කිරීමක්.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඊට අමතරව ගරු සභාපතිතුමනි, මෙවර අයවැයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විෂය භාර අමාත්‍යවරයා වශයෙන් එතුමාගේ විෂය සම්බන්ධයෙන් -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එතුමා මගේ නම කිව්වා, ප්‍රධාන අමාත්‍යවරයා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා එතුමාට අවස්ථාව දෙන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. පොඩ්ඩක් ඉන්න. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ලබන අයවැයේදී මේ පසුගිය අයවැයේදී 2015 දී අතිගරු ජනාධිපතිතුමා පළාත් සභාවලට විශේෂ මුදල් ප්‍රමාණයක් දීලා තිබෙනවා. ඒ වැඩ සටහනේදී ඒ සම්බන්ධව දැනුවත් කරලා සංවර්ධන වැඩ සටහනට ප්‍රමුඛතා ලේඛනයක්, පාසල් මට්ටමේ සංවර්ධන සමිති එක්කහු කරලා කරනවා. ඒ කාරණා කිහිපය තමයි ගරු සභාපතිතුමනි, එතැන කරන්නේ. ඒ නිසා මේ අවුරුද්ද අවසානයේ මැතිවරණය තියලා ප්‍රතිපාදන සොයා ගෙන - ජනාධිපතිවරණයක් ඉලක්ක කර ගෙන නොවෙයි. මේක ඉදිරි වර්ෂවලටත් අපි කරනවා ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා අපේ මන්ත්‍රීවරු, ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරු ගිහිල්ලා ඒ කාරණාව පිළිබඳව හොඳ අධීක්ෂණයක් කරනවා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ නිසා අපි කියනවා ජනාධිපති කරපු දේවල්. අධ්‍යාපනයට. ඉතින් ඕවා රිදෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, හෝමාගම විවිධ සේවා සමුපකාර සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත්තු වැරැදි තීන්දුවක් පිළිබඳව කිහිප වතාවක්ම සමුපකාර කොමසාරිස්තුමාව දැනුවත් කළා. හැබැයි එයින් කිසිම ඵල ප්‍රයෝජනයක් සිද්ධ වුණේ නැහැ. ඉන් පසුව මම විෂයය භාර අමාත්‍යතුමාව දැනුවත් කළා. ඉන් අනතුරුව තමයි ගරු සභාපතිතුමාට අද මේ ප්‍රකාශය කරන්න මම ඉදිරිපත් වුණේ. ගරු සභාපතිතුමනි, හෝමාගම විවිධ සේවා සමුපකාර සංගමය අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් 2014.11.11 වෙනිදා තිබුණා. මෙම රැස්වීමට සහභාගී වෙන්න කියලා අධ්‍යක්ෂ මණ්ඩලයේ මහත්වරුන්ට ලිපියකින් දැනුම් දුන්නා. උප සභාපතිතුමාත්, තවත් කෙනෙකුත්, අපේ අධ්‍යක්ෂ මහත්මයෙකුත් මේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ආවා. 10.00 ට පටන් ගන්න තිබුණු රැස්වීමට මේ අධ්‍යක්ෂ මහත්වරු දෙදෙනා 10.15 ට ආවා. ඒ වෙලාවේදී විවිධ සේවා සමුපකාර සංගමයේ ගරු සභාපතිතුමා කියලා තිබෙනවා, අපි පස් දෙනා තීන්දුවක් ගත්තා. උප සභාපතිතුමා සහ අනෙක් අධ්‍යක්ෂතුමාට මින් ඉදිරියට මේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහභාගී වෙන්න පුළුවන්කමක් නැහැ. අපි ඔබ දෙපළම අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අයින් කළයි කියලා. මම හිතන්නේ, එහෙම නීතියක් අතුරු ව්‍යවස්ථාවල සඳහන් වෙන්නේ නැහැ. මේක සම්පූර්ණ වැරැදි ක්‍රියාවක්. අධ්‍යක්ෂ මණ්ඩලයේ මේ මහත්වරු දෙදෙනාගේ නම් දෙක තමයි විමල් එදිරිසිංහ, දර්ශන රණතුංග. මේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත්තු තීන්දුව ඉතාමත්ම වැරැදි තීන්දුවක් හැටියටයි දකින්නේ. මම නිලධාරියෙක් හැටියට සමුපකාර විෂයය භාර කොමසාරිස්තුමාට කිහිප වතාවක් කථා කරලා කිව්වා, මේක හරි නම් හරි කියන්න කියලා. මේ පිළිබඳව ඒ අය ලිපියකින් දැනුම් දීලා තිබෙනවා ගරු සභාපතිතුමනි. එහෙම නම් මේක හරි නම් හරි කියන්න. වැරැදි නම් වැරැදියි කියන්න. අද වනතුරු ඔය සමුපකාර කොමසාරිස්තුමාගෙන් ඒකේ සත්‍යතාවය දැන ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. මහජන ඡන්දයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වුණු උප සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂ මහත්මයෙකුට - ඉතිහාසයේ මම කවදාවත් දැකලා නැහැ. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ අධ්‍යක්ෂ මහතුන් දෙදෙනාගේ සාමාජිකත්වය තහනම් කරනවා. මේක වැරැදි ක්‍රියාවක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආණ්ඩුවේ වැඩක්.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

නැහැ. මේකට ආණ්ඩුව සම්බන්ධ නැහැ. ආණ්ඩුව සම්බන්ධ නැහැ. පොඩ්ඩක් ඉන්න. අනවශ්‍ය කථා කරන්න එපා. මම කියන්නේ ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔය ආසනයේ කැබිනට් ඇමැතිතුමාගේ මැදිහත්වීම.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒක නිසා ගරු සභාපතිතුමනි, මේක ජීවිත ඉතිහාසයේ ලංකාවේ නොවුණු දෙයක්. මහජන ඡන්දයෙන් පත් වෙලා ආපු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්. ඒ දෙදෙනා ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීන්දුවක් අරගෙන තිබෙනවා. ඔබතුමාගේ මාර්ගයෙන් මම විෂයය භාර ගරු ඇමැතිතුමාට දැනුම් දෙනවා, මෙහි සත්‍යය නම් අයින් කළා කියලා ලිපියක් එවන්න. ඒ අයට මීන් ඉදිරියට උසාවියට යන්න හරි. ඒක සත්‍ය නැහැයි කියනවා නම්, වෙනම ලිපියක් එවන්න කියලා මම ඔබතුමාගේ මාර්ගයෙන් විෂයය භාර ගරු ඇමැතිතුමාට දැනුම් දෙනවා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වලා දීලා, මේ දක්වා ඉතාමත් ශක්තිමත් කරමින් ඉදිරියට ගෙන යන අවදියක මේ රටේ පොදු ජනතාවගේ සේවාවන්, පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් ඉතාමත් නින්දිත විධියට, කැත විධියට, අමනුෂ්‍ය විධියට උල්ලංඝණය කරන අවස්ථා අපට අනේක වාරයක් දකින්න ලැබිලා තිබෙනවා. එහෙම අවස්ථාවක් විධියට අපි දකිනවා, ලංකාවට පෞද්ගලික මගී ප්‍රවාහන සේවාව හඳුන්වලා දීලා පළමුවැනි බලපත්‍රය ලබා දුන්නු දෙල්ගොඩ - පිටකොටුව, කිරිබත්ගොඩ හරහා දෙල්ගොඩ - පිටකොටුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අදාළව තිබෙන 234 බස් සේවාව මේ මොහොත වනකොට සම්පූර්ණයෙන්ම අඩාල වෙලා, බිඳ වැටිලා තිබීම. මේකට අද බලපාන කාරණය තමයි මේ බස් සේවාව පවත්වාගෙන යන සේවකයිනුත් ඒ වාගේම රියදුරු මහත්වරුත් ඉතාමත් බරපතළ අපහසුතාවයට පත් වෙලා තිබෙනවා. ඒකට බලපාන කාරණය තමයි කඩුවෙල - කිරිබත්ගොඩ මගී ප්‍රවාහන සේවාව පවත්වාගෙන යන්නේ 280 බස් සේවාව තුළින්. ඒ වාගේම 256 බස් සේවාව තුළින්. මේ සේවා දෙකම යුද්ධය පැවැති වකවානුවේදී පිරිපහදුව අසලින් ගමන් කිරීම සම්පූර්ණයෙන්ම නවත්වලා වෙන කෙටි මාර්ගයකින් ගමන් කරන්න සලසලා තිබුණා. පවර් හවුස් හන්දියේ ඉඳලා. මෙන්න මේ ගමන් මාර්ගය යුද්ධයෙන් පස්සේ වෙනස් කරලා යථා තත්ත්වයට පත් කළා, 256 route එක පමණක්. හැබැයි තවම 280 route එක පරණ ගල්වලහන්දිය හරහා ගිහිල්ලා මාකොළට පැමිණෙන route එක දිගටම පවත්වාගෙන යනවා. මේ නිසා 234, දෙල්ගොඩ - පිටකොටුව බස් සේවාව සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා ඒක ගෙනියන්න බැරි තත්ත්වයකට අසරණ වෙලා තිබෙනවා. මේ අවස්ථාව වනකොට ඊයේ ඉඳලා මේ සේවාවට අදාළ රියදුරු මහත්වරු ඒ වාගේම සේවක මහතුන් ඒ වාගේම බස් රථ හිමියන් දෙල්ගොඩ මංසන්දියේ දැවැන්ත උද්ඝෝෂණයක නියැලෙනවා. මේ සම්බන්ධව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දැනුම් දුන්නාට ඒ වාගේම අදාළ අමාත්‍යවරයාට දැනුවත් කළත් ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ නිලධාරීන් දැනුවත් කළත් ඒ සඳහා කිසිම සහනයක් ලැබිලා නැහැ. හැබැයි, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය බලපත්‍ර ගාස්තු විධියට මාසයකට රුපියල් 1000 ක් ඒ බලපත්‍රලාභීන්ගෙන් අය කරනවා. ඒ වාගේම පවරා ගැනීමේ ගාස්තු විධියට එක බලපත්‍රයකින් ලක්ෂයක් අය කරනවා. ඒ වාගේම බලපත්‍ර අලුත් කිරීම සඳහා වාර්ෂිකව රුපියල් 7500 ක මුදලක් අය කරනවා. ඒ වාගේම Time Keeper ගාස්තු විධියට රුපියල් 400 කුත්, ඒ වාගේම ගමන් මාර්ග වෙනස් කිරීම සම්බන්ධ බලපත්‍රයට රුපියල් 300 කුත් අය කරනවා. හැබැයි, අද දවස වනකොට දෙල්ගොඩ - කිරිබත්ගොඩ හරහා පිටකොටුව ගමන් මාර්ගය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබෙන අවස්ථාවක ඒ සේවක මහතුන්, බස් රථ රියදුරන්, ඒ වාගේම බස් රථ හිමියන් දැවැන්ත උද්ඝෝෂණයක නියැලෙද්දී මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කිසිම නිලධාරියෙක් ඒ ස්ථානයට පැමිණෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව සාකච්ඡාවක් ලබා දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. අපි ප්‍රවාහනය සම්බන්ධ වගකීම දරන අමාත්‍යවරයාට දැනුම් දෙනවා. ඒ අමාත්‍යවරයා මේ මොහොතේ මේ සභාවේ නැහැ. කඩිනමින් මේ සම්බන්ධ සාකච්ඡා අවස්ථාවක් ලබා දීලා ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයටත්, ඒ වාගේම අද දවසේ රියදුරු මහතුන්, සේවකයින් සහ බස් රථ හිමියන් මුහුණ දෙන ප්‍රශ්නයටත් සැබෑ විසඳුමක් ලබා දෙන්න. පරණ නියමිත route එක, කඩුවෙල ඒ වාගේම ඇළ කන්ද දක්වා route එක නැවත යථා තත්ත්වයට පත් කරලා ඒ පාර්ශවයන් දෙකත් එක්ක සාකච්ඡා කරලා කඩිනමින් නිවැරදි විසඳුම් ලබා දෙන්න කියලා මේ සභාවට යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, අපි පසුගිය පළාත් සභාවේදී ඉරිදා සහ පෝය දිනවල පෞද්ගලික පන්ති පැවැත්වීම දහම් පාසල් සහ විහාරස්ථානවලට යෑම සඳහා තුළ යම් බාධාවක් ඇති වෙනවා කියන කාරණය ප්‍රකාශ කළා. ඒ නිසා ඒ දිනවල පෞද්ගලික පන්ති පැවැත්වීම යම් ප්‍රමාණයකට

සීමා කරන්න කියන කාරණය අපි ඉල්ලා සිටියා. ඒ අනුව අවශ්‍ය පියවරයන් රාශියක් පසුගිය කාල පරිච්ඡේදයේ සිද්ධ වෙලා කටයුතු සිදු වන අවස්ථාවේ අපේ නවක මන්ත්‍රීවරයෙකු වන එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා සිරස මාධ්‍ය ජාලය හරහා ප්‍රකාශ කරලා තිබුණා, එතුමා අලුත් යෝජනාවක් ගෙන ආවා. ඉරිදා දහම් පාසල් යෑමට ඉඩ හදා ගන්න අවශ්‍යයි. ඒ නිසා පන්ති තහනම් කරන්න. ඒ යෝජනාවට ඉඩ දුන්නේ නැහැයි කියලා එතුමා මාධ්‍ය හරහා ප්‍රකාශ කරලා තිබුණා. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, මේ සභාවට යෝජනාවක් ඇවිල්ලා - එතුමා නවක මන්ත්‍රීවරයෙක් හැටියට දන්නේ නැතුව ඇති. එතුමා යෝජනාවක් දුන්නාද කියලා අපි සභා කටයුතු කාරක සභාවෙන් ඇහුවා. දැනට එහෙම යෝජනාවක් පිළිබඳව අවබෝධයක් නැහැ. දැන ගන්න නැහැ. නමුත් එතුමා මාධ්‍ය තුළ වීරයෙක් වෙන්න, පක්ෂයේ තීන්දුවක් නැතුව මේ ප්‍රකාශය කරපු බවයි අපට දැනෙන්නේ. ඉතින් ඒ නිසා විශේෂයෙන් එතුමා නවක මන්ත්‍රීවරයෙක් විධියට ගරු සභාපතිතුමනි, මතක් කරන්න ඕනෑ. මේ යෝජනාව අපි ගෙනැල්ලා නිකම්ම යෝජනාවක් සභාගත කරලා ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මේ යෝජනාව නීතියක් බවට පත් වෙන්න, ප්‍රඥප්තියක් සකස් වෙන්න ඕනෑ. ඒ ප්‍රඥප්තිය සකස් වීම සඳහා ප්‍රඥප්ති කාරක සභාවට ඉදිරිපත් කරලා කෙටුම්පත් කරලා අමාත්‍ය මණ්ඩලයට පවා ඉදිරිපත් කරලා අවශ්‍ය පියවරයන් කරගෙන යනවා. ඒක කෙටි කාලීන කටයුත්තක් නොවෙයි. විධිමත්ම, නිවැරැදිව සිද්ධ කළ යුතු කාර්යයක්. ඒ නිසා එම කාර්ය භාරය අපේ අමාත්‍ය මණ්ඩලය දක්වා ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මරික්කාර් ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය ඉතාම සාවද්‍ය, අසත්‍ය ප්‍රකාශයක් සහ මේ සභාව ගත්තු තීන්දුවක් හැල්ලුවට ලක් කිරීමක් කියලා අපි මතක් කරනවා. අපි ඉතාම නිවැරැදිව ඒ තීන්දුවේ ඉන්නවා. ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිද්ධ වෙනවා කියලා මේ වෙලාවේ මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව කල් තබනවා. ඉන් අනතුරුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.36 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill* 11.36 *a.m. and then resumed.*

# පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*ගරු සභාපතිතුමනි, "2014.09.23 වන දින පැවති පළාත් සභා රැස්වීමේදී හෝ ඉන් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණ ද, ඒ කිසිත් නොතකා, 2014.11.05 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයද සැලකිල්ලට ගෙන, 2014 දෙසැම්බර් මස 01, 02, 03 හා 04 යන දිනයන් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු අතර, 2014 දෙසැම්බර් මස 05 වන දිනය සභා රැස්වීම් නොපැවැත්වෙන දිනයක් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය." යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම - II
PROVINCIAL COUNCIL MEETING - II

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*ගරු සභාපතිතුමනි, "2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය." යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම - III
PROVINCIAL COUNCIL MEETING - III

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

***ගරු සභාපතිතුමනි,** "අද දින (2014.11.18 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2014 දෙසැම්බර් මස 01 වන දින පෙ.ව. 9.00 ට රැස්විය යුතුය" යන යෝජනාව මම ඉදිරිපත්කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*ගරු සභාපතිතුමනි, "සභාවේ වැඩ කටයුතු සඳහා අද දිනය (2014.11.18 දින) පොදු කටයුතු වෙනුවෙන් වෙන් කළ දිනයක් යැයි සළකා ක්‍රියා කළ යුතුය" යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය : 2015 වසර
ANNUAL FINANCIAL STATEMENT : 2015

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

***ගරු සභාපතිතුමනි,*** *"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය." යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

## අයවැය කථාව- 2015 වසර
BUDGET SPEECH – YEAR 2015

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු මන්ත්‍රීවරුනි, හයවන පළාත් සභාවේ පළමුවන මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අද දින ඔබ හමුවේ තබන අතර, මෙය පළාත් සභා ඉතිහාසයේ විසි හත්වන මුදල් ප්‍රකාශයයි. එසේම මෙම මුදල් ප්‍රකාශය මාගේ හයවන මුදල් ප්‍රකාශය වන අතර එය ඔබ හමුවේ තැබීමට ලැබීම මා ලත් භාග්‍යයක් ලෙස සලකනවා.

පසුගිය මැතිවරණයෙන් අප හට විශාල මනාප සංඛ්‍යාවක් ලබා දෙමින් අතිමහත් පැහැදිලි ජන වරමක් ලබාදී මෙතෙක් රාජ්‍ය ප්‍රතිපත්තිය පදනම් වූ පළාත් සභාව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් නිවැරදි බවට ජනතාව තහවුරු කිරීම පිළිබඳ අප බෙහෙවින් සතුටට පත් විය යුතුයි. එම බලය උපරිම වශයෙන් යොදාගෙන පළාතේ ජනතාවගේ දැවෙන ප්‍රශ්න කඩිනමින් විසඳමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම අපගේ මූලික අභිප්‍රායයි. එහිදී මූල්‍ය සම්පතේ සැබෑ හිමිකරුවන් වන ජනතාවගේ අභිවෘද්ධිය මෙන්ම විශ්වාසය ඇතිවන පරිදි එම මුදල් පරිහරණය කිරීම අපගේ යුතුකමක් සහ වගකීමක් සේ මා දකිනවා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත පැහැදිලි ලෙසම අනෙකුත් පළාත් සභා අතරින් වෙන්කර හඳුනාගන්න පුලුවන්. මෙම තත්ත්වය යහපත් මෙන්ම අයහපත් ලක්ෂණවල සංයුතියක් වීම ද මෙහිදී වැදගත් වෙනවා. රටේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 5.6 ක්, එනම් වර්ග කිලෝ මීටර් 3,684 ක් තුළ රටේ මුළු ජනගහනයෙන් සියයට 28.7 ක් වාසය කරන්නේ බස්නාහිර පළාතේයි. රටේ ආර්ථිකයට කරන දායකය සලකන කළ මුළු ජාතික ආදායමින් සියයට 46 ක් සපයන්නේ බස්නාහිර පළාතයි. දිවයිනේ කර්මාන්ත ප්‍රමාණයෙන් සියයට 33 ක් අයත් බස්නාහිර පළාත එහි සමස්ත නිෂ්පාදනයෙන් සියයට 77 ක් එකතු කරනවා. ඒ වගේම ආර්ථික හා පරිපාලන මධ්‍යස්ථාන ගොනුවීම නිසා බස්නාහිර පළාතට ආවේනික බරපතළ ගැටළු ඇති වීමත් සමග විශේෂ වැදගත්කමක් ද ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ආර්ථිකය 2013 වසරේදී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වෙමින් සියයට 7.3 කින් වර්ධනය වූ අතර අඛණ්ඩව වසර පහක් පුරා තනි අංකයක පැවැති උද්ධමනය ක්‍රමයෙන් තවදුරටත් පහළ යමින් වසර අග වනවිට මැදි තනි අංකයක් කරා ළඟා වී තිබෙනවා. මෙම තත්ත්වය පවත්වා ගැනීමට අප පළාතේ දායකත්වය ද විශාල පිටිවහලක් වී තිබෙන බව මාගේ විශ්වාසයයි.

ගරු සභාපතිතුමනි, අපේ රට ආසියා කලාපයේ ශක්තිමත් මැදි ආදායම් ආර්ථිකයක් වශයෙන් සුවිශේෂ සංධිස්ථානයකට පැමිණ තිබෙනවා. සාමය, ආරක්ෂාව හා ප්‍රජාතන්ත්‍රවාදය මනා ලෙස තහවුරු වීම ප්‍රශංසනීයයි. යටිතල පහසුකම්වල දියුණුව ආයෝජන හිතකාමීයි. නව පරපුර අධ්‍යාපන හා නිපුණතා සංවර්ධනයට දක්වන දැඩි

උනන්දුව නිසා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ආශ්‍රිත නව නිපැයුම්වලින් නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුවීම අප රටේ ආකර්ශණීය බව තවත් වැඩි කර තිබෙනවා. ඉතා හොඳින් ඒකාබද්ධ වූ පළාත් සංවර්ධනයත්, කෘෂි හා වාරිමාර්ගවලින් පෝෂණය වන ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයත් මගින් අපේ ආහාර සුරක්ෂිතතාවය හා ජනතාවගේ ජීවනෝපාය මාර්ග ද වැඩි වී තිබෙනවා. එමගින් සමාජ හා ආර්ථික ආසාධාරණයක් වන දරිද්‍රතාවය ද සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතිනවා.

එබැවින් අපේ වර්තමාන කාර්යය වී ඇත්තේ අඩු හා මැදි ආදායම් ලබන ජනතාවගේ අපේක්ෂාවන් ඉටුවන අයුරින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමයි. එම සංවර්ධන ක්‍රියාවලියත් සමඟ උසස් මට්ටමේ සෞඛ්‍ය, අධ්‍යාපන, නිවාස හා ජීවන පරිසරයක් අපේ ජනතාව අපේක්ෂා කරනවා. පළාතේ ජනතාවගේ ආර්ථික හා සමාජ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ප්‍රවාහන හා මාර්ග පහසුකම් මෙන්ම ඔවුන්ගේ අනිකුත් අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වන අයුරින් නාගරික හා ග්‍රාමීය සබඳතාවය පුළුල් කළ යුතුව තිබෙනවා. වැඩ කරන ජනතාවට උසස් ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ඔවුන්ගේ ආදායම් මාර්ග පුළුල් කර දිය යුතුයි. වැඩිහිටි හා ආබාධිත ජන කොටස්වල අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවයකින් යුතුව සැමට සාධාරණ හා සම අවස්ථා ලැබෙන අයුරින් සෑම පුද්ගලයෙකු කෙරෙහිම විශේෂ අවධානය යොමු කළ යුතු වෙනවා.

**උපාය මාර්ග සංවර්ධන සැලසුම් :**
STRATEGIC DEVELOPMENT PLANS :

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන දැනටමත් පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකසා තිබෙන බව අප කවුරුත් දන්නා කරුණක්. ඒ යටතේ ළඟා කර ගත යුතු ඉලක්ක (Goals) සහ ප්‍රමුඛ පරාසයන් (Thrust areas) හඳුනාගෙන තිබෙනවා. ආයෝජන කටයුතු සඳහා මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනු ලබන සියලු ප්‍රතිපාදන එම ප්‍රමුඛ පරාසයන් යටතේ දිස්ත්‍රික් පදනමින් වෙන් කරන අතර දිස්ත්‍රික්කයේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන සාධාරණ වූ ප්‍රතිපාදන බෙදා හැරීමක් එමඟින් බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙම අයවැය ඉදිරිපත් කිරීමේ දී සුවිශේෂ කරුණක් කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට මා කැමතියි. අතිගරු ජනාධිපතිතුමා විසින් දැනට මාසයකට පමණ පෙර රජයේ අයවැය ඉදිරිපත් කළා. එමඟින් ජනතාවට සහන රැසක් ලබා දී ඇති අතර නොයෙක් ආයෝජන ව්‍යාපෘතීන් සඳහා ද අතිවිශාල මුදලක් වෙන් කර තිබෙනවා. දැනටමත් 2015 වසර සඳහා මා විසින් ඉදිරිපත් කර ඇති මුදල් ප්‍රකාශයේ සඳහන් ප්‍රතිපාදනවලට අමතරව අතිගරු ජනාධිපතිතුමා විසින් අයවැය යෝජනා මඟින් සලසන ලද මුදල් ප්‍රතිපාදන ද ලබන වර්ෂය තුළ දී පළාත් සභාව වෙත ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 48,513 ක් වන අතර ඉන් රුපියල් මිලියන 42,127 ක් පුනරාවර්තන වියදම්ය. රුපියල් මිලියන 6,386 ක් ප්‍රාග්ධන වියදම්ය. මෙම වියදම් පියවා ගැනීම සඳහා රජයෙන් ලැබීමට අපේක්ෂිත ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු ඇතුළුව පළාත් සභාව රැස් කිරීමට අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 35,390 ක් වෙනවා. රුපියල් මිලියන 13,123 ක් ප්‍රදාන වශයෙන් රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිතයි. පුනරාවර්තන වියදම්, ආදායම් සහ ප්‍රදාන පිළිබඳ විස්තර පිළිවෙලින් පළමු, දෙවන සහ තුන්වන උපලේඛන වශයෙන් මේ සමඟ ඉදිරිපත් කරනවා.

**පුනරාවර්තන වියදම් :**
RECURRENT EXPENDITURE:

2014 වර්ෂයේ ඇස්තමේන්තු සමග සසඳන විට 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 4,064 කින් එනම් සියයට 10.67 ක වැඩිවීමක් පෙන්නුම් කරනවා. විශේෂයෙන් පුද්ගල පඩිනඩි වියදම 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේ දී සියයට 8.4 කින් වැඩි වීම මෙම තත්ත්වයට ප්‍රධානතම හේතුවයි.

**රුපියල් මිලියන 6,386 ක ප්රාග්ධන වියදම් :**
CAPITAL EXPENDITURE OF RUPEES 6,386 MILLION

2015 වර්ෂයේ අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 6,386 ක්. මෙය වර්ෂයේ දැරීමට අපේක්ෂිත මුළු වියදමින් සියයට 13.16 ක් වෙනවා. එය 2014 වර්ෂයේ වෙන් කළ ප්‍රාග්ධන වියදමට වඩා සියයට 13.15 ක වැඩිවීමක්. 2014 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,745 ක් ලබාදුන් අතර 2015 වර්ෂයේදී මේ යටතේ ලබා දීමට එකඟ වී ඇති මුදල රුපියල් මිලියන 1,977 ක්. විශේෂිත ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,146 ක් ලබා දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විසි වර්ෂයකට වැඩි පළාත් සභා ඉතිහාසයේ මුළු ඇස්තමේන්තුගත වියදමින් ප්‍රාග්ධන වියදම සියයට 10 ක් ඉක්ම වූ අවස්ථා ඉතා අල්පයි. පසුගිය වර්ෂ තුනේදී සියයට 10 ඉක්මවා එය පවත්වා ගැනීමට අපට හැකි වුණා. 2015 වර්ෂයේ ද එම තත්ත්වය පවත්වා ගැනීමට හැකි වී තිබෙනවා. නොයෙක් අභියෝග හමුවේ වුවද අඛණ්ඩව වර්ෂ හතරක් සියයට 10 කට වැඩි ප්‍රාග්ධන වියදමක් පවත්වා ගෙන යැමට හැකි වීම අප ලද විශාල ජයග්‍රහණයක්.

**මානව සම්පත් කළමනාකරණය :**
HUMAN RESOURCE MANAGEMENT:

දැනුම පදනම් වූ ආර්ථිකයක් ගොඩ නැංවීමට ක්‍රියා කරන අවස්ථාවක අපේ සංවර්ධන ක්‍රියාදාමයන් සාර්ථක කර ගැනීමට නම් මානව සම්පත ඉතා අත්‍යවශ්‍ය සාධකයක්. නිසි වේලාවට සේවකයන් බඳවා ගැනීම්, උසස් වීම් ලබා දීම්, විභාග පැවැත්වීම් ආදිය කළ යුතු වෙනවා. මෙම සියලු කාර්යයන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති අතර කොමිෂන් සභාව විසින් වර්ෂයේ කරන ලද කාර්යයන් සහ 2015 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක ඇතුළත් වාර්තාවක් හතරවන උපලේඛනය වශයෙන් මේ සමඟ ඉදිරිපත් කරනවා.

**රුපියල් 900 කට රක්ෂණාවරණයක් :**
INSURANCE COVER FOR JUST RUPEES 900/-

ගරු සභාපතිතුමනි, නොයෙක් අවස්ථාවල මා රාජ්‍ය සේවකයන් සමඟ කතා කිරීමේ දී අවබෝධ කර ගත් ගැටළුවක් වන්නේ සුභසාධන කටයුතු කෙරෙහි ඔවුන් සහ අප දක්වන උනන්දුව ප්‍රමාණවත් නොවීමයි. තරුණ අය දියවැඩියාව, හෘද රෝග වැනි බෝ නොවන රෝගවලට ගොදුරු වෙලා. එවැනි රෝගයක් වැළඳුන විට ඒ සඳහා වියදම් දැරිය නොහැකිව ඔවුන් අසරණ වූ අවස්ථා මා දැක තිබෙනවා. මෙයට පිළියමක් වශයෙන් රු.900/- ක් වැනි සුළු වාර්ෂික වාරිකයක් ගෙවා ජීවිත රක්ෂණාවරණයක් ලබා දීමට අපට හැකි වුණා. මෙම රු.900/- න් සේවකයා ගෙවිය යුත්තේ රු.450/- ක් පමණයි. ඉතිරිය පළාත් සභාවෙන් ගෙවනවා. දැනටමත් 15,000 ක සේවක පිරිසක් මෙම රක්ෂණ ආවරණය ලබා ගෙන තිබෙනවා. මෙමඟින් අසාධ්‍ය රෝග 24 ක් ආවරණය කරනු ලබන අතර අසාධ්‍ය රෝගයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 5 ක් ද, දීර්ඝකාලීන හා තාවකාලික අකර්මණ්‍යාවලදී රුපියල් ලක්ෂ 5 ක් ද, හදිසි අනතුරු මරණයක දී රුපියල් ලක්ෂ 10 ක් ද වන්දි ගෙවනවා. පළාතේ සියලු නිලධාරීන් වෙනුවෙන් මෙම රක්ෂණ ආවරණය ලබා දීමට මා බලාපොරොත්තු වන අතර පළාත් සභාවෙන් දැරිය යුතු වියදම් දැරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

*ගරු සභාපතිතුමනි, අපි ගුරුවරුන් සඳහා ආරම්භ කරපු මේ වැඩ පිළිවෙළ සියලුම පළාත් රාජ්‍ය සේවකයින් වෙනුවෙන් මේ 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.*

**නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් මිලියන 18,670 ක් :**
RUPEES 18,670 MILLION FOR FREE EDUCATION

ගරු සභාපතිතුමනි, සමාජ සංවර්ධනය පිළිබඳව අපේ රට විශාල ප්‍රසිද්ධියක් උසුලනවා. අධ්‍යාපනය නොමිලේ ලබාදීම පමණක් නොව පාසල් පොත්, නිල ඇඳුම්, වාර ප්‍රවේශපත්‍ර, දිවා ආහාර සහ වෙනත් විවිධ ආධාර සියල්ල නොමිලේ ලබා දෙන ලෝකයේ තවත් රටක් ඇතැයි මා විශ්වාස කරන්නේ නැහැ. නිදහස් අධ්‍යාපනය මේ අයුරින් පුළුල්ව පවත්වා ගැනීමට රජයේ සමස්ත වියදමින් සියයට 9 ක් වැය කරනවා. පළාතේ සමස්ත වියදමින් සියයට 38 ක් වැය කරන්නේ අධ්‍යාපනයටයි. මා එය දකින්නේ අනාගත ආයෝජන වියදමක් වශයෙන්. ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම් පිළිබඳව සාධාරණ ඇගයීමක් ලැබෙන්නේ අනෙකුත් රටවල පුරවැසියන්ට එක සමානව නොමිලේ අධ්‍යාපනයක් ලබා දීමට කරනු ලබන වියදම් සමඟ සැසඳීමෙන් පමණයි. පෞද්ගලික අංශයේ දායකත්වයත් සමඟ බැලුවහොත් මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් වාර්ෂිකව රුපියල් බිලියන 310 ක් පමණ වැය කරනවා. එය දළ ජාතික ආදායමින් සියයට 4.1 ක් වෙනවා. පාසලක භෞතික තත්ත්වය, දරුවකුගේ ගුණාත්මක දැනුම, ගුරුවරුන්ගේ හැකියාවන් පිළිබඳව වර්ෂ 10 කට පෙර තත්ත්වය, වර්තමාන තත්ත්වය සමග සංසන්දනය කර බැලිය යුතුයි. සිදු වී ඇති වෙනස අව්‍යාජව දකින ලෙස සියල්ලන්ගෙන්ම මා ඉල්ලා සිටිනවා.

දීර්ඝ කාලයක් තිස්සේ පැවති ගුරු හිඟය දැන් සම්පූර්ණයෙන් අවසන් වෙලා. පසුගිය වර්ෂ තුන තුළ පමණක් ගුරුවරුන් 10,089 ක් අළුතින් සේවයේ යෙදවීමට අපට හැකි වුණා. ඒ අනුව වර්තමානයේ බස්නාහිර පළාතේ සිසු ගුරු අනුපාතය 21:1 වශයෙන් පවත්වාගෙන යාමට අපට හැකි වී තිබෙනවා. අපගේ පාලන කාලය තුළ ගුරු හිඟය සම්පූර්ණයෙන් අවසන් කිරීමට හැකිවීම පිළිබඳව

මා අවංකව සතුටු වෙනවා. පළාතේ උපාධිධාරී සියල්ලන්ටම වාගේ දැන් ගුරු පත්වීම් ලබා දීලා තිබෙනවා.

*ගරු සභාපතිතුමනි, 2008 වර්ෂයේ අපට ගුරු විභාගය සමත් සියලු දෙනාටම ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම 2011 ගුරු විභාගය සමත් සියලු දෙනාට වාණිජ කොටස - එක කොටසක් හැරෙන්න අනික් සියලු දෙනාට ලබා දෙන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම 2015 වර්ෂයේ දැන් විභාගය කැඳවලා තිබෙනවා. විභාගයේ ප්‍රතිඵල එනතුරු අපි බලාපොරොත්තු වෙනවා, ස්වේච්ඡාවෙන් දැනට පළාත තුළ සේවය කරන ඒ විභාගය සමත් ගුරුවරුන්ට ලබා දෙන්න. ඒ වාගේම 2011 ගුරු විභාගය අසමත් අයට, මේ වන විට සියලු දෙනාටම වාගේ සංවර්ධන සහකාර පත්වීම් ලබා දෙන්නත් අපට හැකියාව ලැබුණා.*

වර්තමානයේ අපේ රට පවතින්නේ මැදි ආදායම් රටක් වශයෙන්. එහිදී ජනතාවගේ ආදායම් මට්ටම් වෙනස් වීම හේතු කොටගෙන වසර 2020 වනවිට අපගේ ජීවන රටාවන් සහ වෘත්තීය රටාවන් වෙනස්කම්වලට භාජනය වෙනවා. මේ නිසා ශිෂ්‍යයන් සාපේක්ෂ වශයෙන් දෙමාපියන් සහ ගුරුවරුන් මත යැපෙන තත්ත්වයෙන් මිදී සමාජයේ වෙනස් වන පරිසරයන්ට හැඩගැසිය හැකි ස්වාධීනව ඉගෙනුම ලබන පරිණත පුද්ගලයින් බවට පත්වීමට මෙරට අධ්‍යාපනය හදාරන සිසු දරුවන්ට උපකාර කළ යුතුයි. එම කාර්යය කරන්න නම් එයට අනුගත වන පරිදි අපේ ගුරුවරුන් පුහුණු කළ යුතුයි. මෙය තේරුම්ගත් අතිගරු ජනාධිපතිතුමා 2013 අයවැය මගින් ගුරු පුහුණු සඳහා රුපියල් මිලියන 900 ක් වෙන් කළා. ඉන් අප පළාතට ලැබූ ප්‍රතිපාදන ද සමඟින් රුපියල් මිලියන 103 ක් වැය කරමින් 2013 සහ 2014 වර්ෂ දෙකෙහි ගුරුවරුන් 7,435 ක් පුහුණු කළා. මෙම විශේෂ වූ පුහුණුව දිගටම පවත්වාගෙන යා යුතුයි. ඒ අනුව 2015 වර්ෂයේ ද මෙම පුහුණු කටයුතු සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

නවීන සමාජයට ගැලපෙන මානව සම්පතක් පාසල තුළින් ලබා ගැනීමට නම් පාසල් පද්ධතිය සැලකිය යුතු තරමින් නවීකරණය කිරීම අත්‍යාවශ්‍යයි. පන්ති කාමරයක් තුළ පැවතිය යුත්තේ ඩෙස්ක් සහ පුටු පමණක් නොවෙයි. සුන්දර වූ පරිසරයක් ඒ තුළ පැවතිය යුතුයි. **" අපේ පාසල අපේ දැතින් සුරකිමු "** වැඩ සටහනින් පන්ති කාමරය තුළ සුන්දර වූ පරිසරයක් ගොඩනැංවෙනවා. පසුගිය වර්ෂ තුන තුළ රුපියල් මිලියන 372 ක් වැය කරමින් පංති කාමර වර්ණාලේප කළා. 2014 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 100 ක් වෙන් කර තිබෙන අතර 2015 වර්ෂයේදී මෙකී කාර්යය සඳහා තවත් රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට සැලසුම් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පළාත් සභා ආරම්භ වූ අවධියේ පටන් එනම් අවුරුදු 20 කට වැඩි කාලයක් පුරා අපට පැවති ප්‍රධානතම ගැටළුව භාවිතයට ගැනීමට අපහසු අඩක් නිම වූ පාසල් ගොඩනැඟිලි රාශියක් පැවතීමයි. භාවිතයට නොගත්තත් මෙම ගොඩනැඟිලි සඳහා වැය කර තිබූ මුදල ඉතා විශාලයි. මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා සමග සාකච්ඡා කර සාමාන්‍ය පරිදි ලබා දෙන ප්‍රදානවලට අමතරව රුපියල් මිලියන 1,150 ක ප්‍රදානයක් වර්ෂ තුනක් තුළ ලබාගෙන සෑහෙන ගොඩනැගිලි සංඛ්‍යාවක වැඩ අවසන් කර තිබෙනවා. ගොඩනැගිලි සියල්ලගේම සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කිරීමට තවත් රුපියල් මිලියන 450 ක් පමණ අවශ්‍ය වන අතර එම මුදල ද රජයෙන් ලබාගෙන මෙම කාර්යය 2015 වර්ෂය තුළ සම්පූර්ණයෙන් අවසන් කිරීම අපේ බලාපොරොත්තුවයි.

සිසුන් සංඛ්‍යාව 50 ට වඩා අඩු වීමෙන් වැසී යාමේ තර්ජනයට මුහුණ පා තිබූ පාසල් 94 ක් 2009 වර්ෂය වන විට පැවතුණා. නමුත් මේ වනවිට එම පාසල් සංඛ්‍යාව 66 දක්වා අඩු කර ගැනීමට හැකි වී තිබීම සාර්ථක ප්‍රවණතාවයක්. මෙම සාර්ථකත්වයට ප්‍රධාන හේතුව, එම පාසල්වල පරිගණක විද්‍යාගාර ආරම්භ කිරීමයි. පරිගණක 84 ක් පසුගිය කාලය තුළ ලබා දී තිබෙනවා. 2015 වර්ෂයේ දී ද මෙම පාසල්වලට පරිගණක ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

මෙම සෑම කාර්යයකින්ම අප බලාපොරොත්තු වන්නේ පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අ.පො.ස.(සා.පෙළ) සහ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල ක්‍රමයෙන් වර්ධනය කර ගැනීමයි. එම අරමුණ අප ඉෂ්ට කරගෙන තිබෙනවා.

පහ වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට ඉන් සමත් වූ ප්‍රතිශතය 2011 වර්ෂයේ සියයට 10.05 ක්. නමුත් 2013 වනවිට එය සියයට 10.74 දක්වා වර්ධනය වෙලා.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට උසස් පෙළ හැදෑරීමට සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 2009 වර්ෂයේ සියයට 57 ක් වුවත් 2012 වන විට එය සියයට 66.72 ක් දක්වා වර්ධනය වී තිබෙනවා.

2015 අධ්‍යාපන සංවර්ධනය සඳහා ප්‍රමුඛ පරාස 4 ක් යටතේ රුපියල් මිලියන 867 ක් වෙන් කරනවා. මෙකී මුදල ඒ ඒ දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පාදක කර ගනිමින් දිස්ත්‍රික්ක අතර බෙදා දීමට ද කටයුතු කරනවා.

පුනරාවර්තන වියදම් ද ඇතුළුව අධ්‍යාපනයට අදාළ සියලු කාර්යයන් වෙනුවෙන් 2014 වර්ෂයේ රුපියල් මිලියන 17,936 ක් වෙන් කළ අතර 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 18,670 ක් වෙන් කරනවා. එය 2014 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 4.09 ක වැඩිවීමක්.

**දහම් පාසලකට රුපියල් ලක්ෂයක් :**
RUPEES HUNDRED THOUSAND FOR EACH DAHAM SCHOOL

ගරු සභාපතිතුමනි, විෂයය දැනුමට පමණක් සීමා නොවූ කරුණාව, දයාව සහ ගුණගරුකභාවයෙන් පිරිපුන් දරුවකු සමාජයට බිහි කිරීමට දහම් පාසල් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. වර්තමාන දරුවන් දහම් පාසල් යාමට පෙළඹුණත් එහි දී අපට අභියෝග රැසකට මුහුණ පෑමට සිදු වෙලා. ඩෙස්ක්, බංකු, පුටු මෙන්ම වැසිකිළි, කැසිකිළි පහසුකම් ද, පානීය ජල අවශ්‍යතා වැනි දහම් පාසලට අවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීම එම අභියෝගයයි. එහෙයින් පළාතේ සෑම දහම් පාසලකටම රුපියල් ලක්ෂය බැගින් ලබා දීමේ වැඩ පිළිවෙලක් අප ආරම්භ කළා. ඒ අනුව පළමු අදියර යටතේ දහම් පාසල් 2056 ක වත්, දෙවන අදියර යටතේ දහම් පාසල් 2021 කටත් වශයෙන් දහම් පාසලකට රුපියල් ලක්ෂ දෙකක් ලබා දී තිබෙනවා. මෙම වැඩ සටහනට පළාතේ ජනතාව අතර විශාල ප්‍රසාදයක් හිමි වී තිබෙන බව මා දන්නවා. එහෙයින් 2015 වර්ෂයේ ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

*ගරු සභාපතිතුමනි, 2014 වර්ෂයේ දහම් පාසල් ආධාර ලබා දීමේ වැඩ සටහන ඉදිරි සති දෙක ඇතුළත අපි ක්‍රියාත්මක කිරීමටත් බලාපොරොත්තු වෙනවා.*

**පළාත් පාලන කටයුතු :**
LOCAL GOVERNMENT AFFAIRS

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම මහජනතාවට ඉතා කිට්ටුවෙන්ම පවතින පරිපාලන ආයතනය පළාත් පාලන ආයතනයයි. පළාත් පාලන ආයතනයක් මහජනතාවට ප්‍රජා සේවයක් සිදු කරමින් විශිෂ්ට කාර්යභාරයක් සිදු කරනවා. මෙම කාර්යය අප දැකිය යුතුයි. එසේම අගය කළ යුතුයි. පළාත් පාලන ආයතනවල පුනරාවර්තන වියදම දැරීම සඳහා 2014 වර්ෂයේ රුපියල් මිලියන 5,059 ක් ලබා දුන් අතර 2015 වර්ෂයේදී ඒ සඳහා රුපියල් මිලියන 5,671 ක් වෙන් කර තිබෙනවා.

පළාත් සභා මාර්ගවලින් සියයට 70 කට වැඩි ප්‍රමාණයක් කාපට් කර පූර්ණ සංවර්ධනය කර තිබුණ ද පළාත් පාලන මාර්ග තවමත් එම තත්ත්වයට පත්වී නැහැ. කොන්ක්‍රීට් නොකළ, ගල් අතුරා නැති මාර්ග තවමත් පවතිනවා. එම නිසා පළාතේ එම මාර්ග සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 155 ක් වෙන් කරනවා. 2015 වර්ෂයේ දී ග්‍රාමීය දුෂ්කර මාර්ග සහ ග්‍රාමීය කුඩා පාලම් වැඩි දියුණු කිරීමට සැලසුම් කර තිබෙන අතර ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනවා. එසේම සතිපොළ සංවර්ධනය, ජ්‍රජා ජල ව්‍යාපෘති සහ ආදාහනාගාර ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 39 ක් ද වෙන් කිරීමට මා යෝජනා කරනවා.

**අපද්‍රව්‍ය කළමනාකරණය :**
WASTE MANAGEMENT

ගරු සභාපතිතුමනි, රටේ සියලු ජනතාවට අයත් අගනුවර, පරිපාලන නගරය, ගුවන් තොටුපොළවල්, වරාය, ආරක්ෂක මූලස්ථාන වැනි ජාතික සම්පත් අප පළාත තුළ පිහිටා ඇති නිසා රටේ සියලුම පළාත්වල ජනතාවට සේවා ලබාදීමට ද ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ද බස්නාහිර පළාතට සිදුවී තිබෙනවා. පරිපාලන හා සේවා මධ්‍යස්ථාන බොහොමයක් බස්නාහිර පළාතට අයත්වීම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් රැකියාවලට පැමිණීම මෙන්ම ඔවුන් පළාත තුළ ස්ථානගත වීම ද දක්නට ලැබෙනවා. මේ හේතුවෙන් සමස්ත ශ්‍රී ලංකාවේ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් සියයට 60 ක් බස්නාහිර පළාත තුළ ජනනය වීම විශාල අභියෝගයක් වෙලා. එසේම අපද්‍රව්‍ය ජනනය වීම වාර්ෂිකව සියයට 1.2 කින් ඉහළ යාම හේතුකොට ගෙන වර්ෂ 2050 වනවිට වර්තමානයේ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය දෙගුණවීමේ ප්‍රවණතාවයක් පවතිනවා. මෙම සියලු අභියෝගයන්ට අප මුහුණ දිය යුතු අතර අපද්‍රව්‍ය

සම්බන්ධයෙන් ඉක්මන් දිගුකාලීන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතු වී තිබෙනවා.

අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යය සෘජුවම පළාත් පාලන ආයතනවලට අයත් වුවද එම ආයතනවලට තනිවම එම කාර්යය කිරීමේ හැකියාවක් නැහැ. එසේ වුවද ඒ ඒ පළාත තුළ ජනනය වන අපද්‍රව්‍ය ඒ ඒ පළාතටම භාවිතයට ගත හැකිවන අයුරින් එම පළාත තුළම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව මාගේ විශ්වාසයයි. එම නිසා එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතන උනන්දු කළ යුතු අතර ඒ සඳහා ආධාර ද සැපයිය යුතුයි. එවැනි ආධාර සැපයීම සඳහා රුපියල් මිලියන 75 ක් මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**ඉඩම් පරිහරණය :**
LAND UTILIZATION

ගරු සභාපතිතුමනි, ඉඩම් පිළිබඳ බලතල මධ්‍යම රජය යටතේ පැවතුණ ද රජය සතු ඉඩම්වලින් ලැබෙන දිගුකාලීන බදු, වාර්ෂික බදු සහ එලදා බදු පළාත් සභාවේ ආදායම් මාර්ගයක්. 2013 වර්ෂයේ බදු ආදායම් වශයෙන් රුපියල් මිලියන 79 ක් එකතු කරගෙන ඇති අතර 2015 වර්ෂයේදී රුපියල් මිලියන 130 ක් එකතු කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් තිඹිරිගස්යාය සහ කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ රජය සතු විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. සමහර ඉඩම්වලින් අය වෙන්නේ ඉතා සුළු බදු මුදලක්. එම ඉඩම් නැවත තක්සේරු කිරීම් සහ ගිවිසුම් යාවත්කාලීන කිරීම කළ යුතුයි. හිඟ බදු අයකර ගැනීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සම්බන්ධ වී මේ පිළිබඳව ඉක්මනින් කටයුතු කරන ලෙස මා පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබෙනවා. මේ පරිදි කටයුතු කළහොත් ඇස්තමේන්තු ගත ආදායමට වඩා දෙගුණයකින් බදු ආදායම් වැඩි කරගත හැකි බව මාගේ විශ්වාසයයි.

**නෙතට අරුණ වැඩසටහන :**
NETHATA ARUNA PROGRAMME

බස්නාහිර පළාතේ වෙසෙන සමෘද්ධිලාභී පවුල් පිළිබඳව විශේෂයෙන් සලකා බැලීමේ දී අපට පෙනී ගිය කරුණක් වූයේ එම පවුල්වල සාමාජිකයන්ට සිය දෛනික කටයුතු කර ගෙන යෑමට බාධාවක් වී ඇති පෙනීමේ දුබලතාවයයි. එයට යම් පිළියමක් වශයෙන් ඔවුන් සවිබල ගැන්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අදියරයන් දෙකක් යටතේ නොමිලේ ඇස් කණ්ණාඩි 77,030 ක් ලබා දී තිබෙනවා. මෙම වැඩ සටහන 2015 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 9,743 ක් :**
RUPEES 9,743 FOR HEALTH AFFAIRS

ගරු සභාපතිතුමනි, අපගේ සෞඛ්‍ය දර්ශකයන් සියල්ල දියුණු රටවල මට්ටමක පැවතීම නිදහස් සෞඛ්‍ය සේවාව ලබා ගත් විශිෂ්ට ජයග්‍රහණයක්. සාමාන්‍යයෙන් නොදියුණු රටක පවතින රෝග හා සෞඛ්‍ය ගැටළු රාශියක් විසඳා ගැනීමට අප සමත් වී තිබෙනවා. අපේ පළාතේ බෝවන රෝග සැහෙන දුරකට අවම වෙලා. නමුත් දියවැඩියාව, අධික රුධිර පීඩනය, කොලෙස්ටරෝල් වැනි බෝ නොවන රෝගවලට ලක් වීමේ අවධානම වැඩි වී තිබෙනවා. මෙවැනි රෝග සම්බන්ධයෙන් වඩාත් වැදගත් වන්නේ රෝගය ඇති වූ පසු එය සුව කිරීමට වඩා රෝග සෑදීම වළක්වා ගැනීමට දැනුවත් කිරීමයි. මේ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර අවශ්‍ය කටයුතු කරන ලෙස දැනටමත් මා සෞඛ්‍ය සේවා අංශවලට උපදෙස් දී තිබෙනවා.

භෞතික වශයෙන් සෞඛ්‍ය සේවය කෙතරම් දියුණු වුවත් රෝහල කරා පැමිණෙන ජනතාවට නිකරුණේ එහි විශාල කාලයක් ගත කිරීමට සිදු වෙලා. මෙයට පිළියමක් වශයෙන් **"ඉ - රෝහල්"** ව්‍යාපෘතිය යටතේ පානදුර, දොම්පේ සහ අවිස්සාවේල්ල යන රෝහල් තුනෙහි ආරම්භ කරන සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ වැඩ සටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. මෙය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර වන්නේ බාහිර රෝගී අංශය, බෙහෙත් නිකුත් කිරීමේ අංශය සහ රෝහල් රසායනාගාරය ජාලගත කර සම්බන්ධ කිරීමයි. දෙවන අදියර වන්නේ රෝහල් වාට්ටු, සායන සහ අනෙකුත් අංශ මෙම තොරතුරු ජාලයට ඒකාබද්ධ කිරීමයි. තුන්වන අදියර වන්නේ රෝහල් අතර තොරතුරු හුවමාරු කිරීම සඳහා එම රෝහල් ජාලගත කිරීමයි.

මෙහි පළමුවන අදියර ඉහත රෝහල් තුනෙහි සාර්ථකව ක්‍රියාත්මක වන අතර එමගින් බාහිර රෝගීන්ට රෝහල තුළ ගත කළ යුතු කාලය විශාල ලෙස අඩු වෙලා. අනෙකුත් රෝහල් ද ඇතුළුව සියලු අදියරයන් ඉදිරි වර්ෂය තුළ

ක්‍රියාත්මක කිරීම අපගේ ඉලක්කයයි. මෙමඟින් රෝහල්වල තදබදය අවම කිරීම මෙන්ම රෝගියාගේ අතීත සෞඛ්‍ය තත්ත්වයන් සියල්ල පරිගණක දත්ත පද්ධතියක ඇතුළත් කර තැබීම සිදු වෙනවා.

රෝහල්වල භෞතික සම්පත් සංවර්ධනය සඳහා ද පසුගිය වර්ෂ දෙකෙහි රුපියල් මිලියන 1,000 ක ට වැඩි මුදලක් වියදම් කර ඇති අතර පානදුර රෝහල සඳහා රුපියල් මිලියන 200 ක්ද, මිනුවන්ගොඩ රෝහලෙහි ලේ බැංකුව සහ ශල්‍යාගාරය සඳහා රුපියල් මිලියන 123 ක් ද වැය කර එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දී තිබෙනවා.

සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් විශාල මුදලක් වෙන් කළ ද මදුරුවන් මගින් ඇතිවන පීඩා අප පළාතේ විශාල අර්බුදයක් වෙලා. ඩෙංගු රෝගය පැතිරීම වළක්වා ගැනීම අපහසු වී තිබුණ ද එමගින් ඇතිවන මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමට හැකි වුණා. 2014 වර්ෂයේදී ඩෙංගු රෝගීන් 12,042 ක් වාර්තා වූ අතර මරණ සංඛ්‍යාව 27 දක්වා අවම කර ගැනීමට හැකිවීම අපගේ උත්සාහයේ ප්‍රතිඵලයක්. ඩෙංගු වැළඳීම සහ මරණ සංඛ්‍යාව හැකිතාක් අඩු කර ගැනීම අපගේ අරමුණයි.

ප්‍රමුඛ පරාස 5 ක් යටතේ සෞඛ්‍ය සේවයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 764 ක් මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා. එය කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක තුන සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 244 ක්, 288 ක් සහ 232 ක් වශයෙන් තවදුරටත් වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

එසේම පුනරාවර්තන වියදම් ද ඇතුළුව සෞඛ්‍ය සේවයේ සියලු කාර්යයන් සඳහා 2015 වර්ෂයේ රුපියල් මිලියන 9,743 ක ප්‍රතිපාදන සලසා ඇති අතර එය 2014 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 24.54 ක වැඩිවීමකි.

**දේශීය වෛද්‍ය සේවය :**
INDIGENOUS MEDICAL SERVICE

ගරු සභාපතිතුමනි, නිදහස් සෞඛ්‍ය සේවය සහ මෑත වර්ෂවල එහි ඇතිවූ වර්ධනය හේතුවෙන් සෞඛ්‍ය සේවය විසින් අත්කර ගත් ජයග්‍රහණ මේ වන විට අභියෝගයට ලක් වෙලා. වියපත් ජනගහන අනුපාතය ඉහළ යෑම හේතුවෙන් වැඩ කළ හැකි වයසේ පසුවන ජන අනුපාතය ක්‍රමයෙන් අඩු වී යැපීම් ජන අනුපාතය ඉහළ ගොස් තිබෙනවා. මෙම තත්ත්වය බෝවන රෝග වැළඳෙන රෝගීන් සංඛ්‍යාවට වඩා බෝ නොවන රෝගීන් සංඛ්‍යාව වැඩි කිරීමට හේතු වෙලා. බෝ නොවන රෝග සඳහා බටහිර වෛද්‍ය ක්‍රමය සේම දේශීය වෛද්‍ය ක්‍රමය ඉතා වැදගත් බව මාගේ විශ්වාසයයි.

සමහර බෝ නොවන රෝග දේශීය වෛද්‍ය ක්‍රමය මගින් නිට්ටාවටම සුව කළ හැකි බව ජනතාවට අප පෙන්නුම් කළ යුතුයි. මෙම වෛද්‍ය සේවය ඉතා අඩු පිරිවැයකට ලබා ගන්නත් පුළුවන්. මේවා පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා 2013 වර්ෂයේ රුපියල් මිලියන 7 කට ආසන්න මුදලක් වැය කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩ සටහන් 1,563 ක් පවත්වා ඇති අතර 2015 වර්ෂයේ එවැනි වැඩ සටහන් 1,000 කට වැඩි සංඛ්‍යාවක් පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා. මෙම වියදම්වල ප්‍රතිඵලය ලැබෙන්නේ දිගුකාලීනවයි.

එමෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමය අන්තර් ජාතික ආකර්ෂණය ලබාගත හැකි වන පරිද්දෙන් දියුණු කළ යුතුයි. වසර 2020 වනවිට ඵලදායී දේශීය වෛද්‍ය සත්කාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව **"වෛද්‍ය සංචාරක"** නැවතුමක් කිරීම අපේ ඉලක්කයයි. මේ මගින් දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වයට අමතරව විවිධ රැකියා අවස්ථා ද ජනිත වෙනවා.

මේ සඳහා ආයුර්වේද රෝහල් හා ප්‍රතිකාර ආයතනවල යටිතල පහසුකම් ද වැඩිදියුණු කිරීම අවශ්‍යයි. පසුගිය වර්ෂ දෙකේ දී ප්‍රධාන ආයුර්වේද රෝහල් තුනක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට වියදම් කළ මුදල පමණක් රුපියල් මිලියන 129 ක්. දේශීය වෛද්‍ය සේවයේ සංවර්ධනය වෙනුවෙන් මෙම මුදල් ප්‍රකාශයෙන් රුපියල් මිලියන 76 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

**පරිවාස හා ළමාරක්ෂක කටයුතු :**
PROBATION AND CHILD CARE SERVICES

ගරු සභාපතිතුමනි, අප කොතෙක් දේ දිනා ගත්තත් සමාජයට වැදගත් වන්නේ අම්මා, තාත්තා සහ දරුවන්ගෙන් සැදුම්ලත් පවුල් ඒකකයයි. යම් දරුවෙකු එම පවුල් ඒකකයෙන් දුරස් වී අනාථ, අත්හල, අසරණ හා අපයෝජනයට ලක්වූ දරුවෙකු වෙනවා නම් එය සමාජයේ වරදක් මිස දරුවාගේ වරදක් යැයි මා දකින්නේ නැහැ. එවැනි දරුවන් රැකබලා ගැනීම අපගේ යුතුකමක්.

පවුල් ඒකකයෙන් දුරස් වී දරුවන් 3,900 ක් පමණ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල රැකවරණය ලබනවා. මෙම ළමුන්

සමාජගත කළ යුතු වුවත් එය අසීරු කටයුත්තක් වෙලා. 2014 වර්ෂයේ ළමුන් 62 ක් පමණක් දෙමව්පියන් වෙත භාර දීමෙන් මෙම තත්ත්වය පැහැදිලි වෙනවා. අපහසුතාවයෙන් වුවත් දරුවන් දෙමව්පියන්ගේ රැකවරණයට පත් කළ හැකි නම් එය දරුවන් වෙනුවෙන් කරන උතුම් කාර්යයක්.

ආගම, සංස්කෘතිය සහ සම්ප්‍රදායන්ගෙන් පෝෂණය වූ අපේ සමාජයේ ළමා මව්වරුන් වැඩිවීම ඉතා කනගාටුදායක තත්ත්වයක්. 2013 වර්ෂයේ ළමා මව්වරුන් 25 දෙනෙකුට සහ ඔවුන්ගේ දරුවන්ට රැකවරණය ලබා දීමට සිදු වූ අතර 2014 වර්ෂයේ දැනට ළමා මව්වරුන් 17 දෙනෙකුට එසේ රැකවරණය සලසන්න සිදු වෙලා.

මෙම සියලු කාර්යයන් වෙනුවෙන් 2014 වර්ෂයේ රුපියල් මිලියන 181 ක් වෙන් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 194 ක් වෙන් කරනවා.

**මාර්ග පද්ධතිය :**
ROAD SYSTEM

ගරු සභාපතිතුමනි, ගොඩබිම මත පහසු ප්‍රවේශයක් ඇති කරමින් වැඩි දියුණු කළ නවීන මාර්ග ජාලයක් පවත්වා ගැනීම ජාතික මාර්ග ප්‍රතිපත්තියයි. මෙය ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඵලදායීතාවය ඉහළ නැංවීමට උපකාරී වන සේම, ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ( Ease of Doing Business ) නැමැති ශ්‍රේණිගත කිරීම් දර්ශකයෙහි ශ්‍රී ලංකාවේ ස්ථානය ඉහළ නැංවීමට සහ විදේශ ආයෝජකයන් තුළ රටේ ප්‍රතිරූපය ගොඩනැංවීමට ද හේතු වෙනවා.

මෙම ජාතික ප්‍රතිපත්තියට අනුකූලව **"ජාතික මාර්ග පද්ධතිය සමග සම්බන්ධ වූ ආරක්ෂිතවූත්, උපරිම සුවපහසුව සලසන්නාවූත් මාර්ග පද්ධතියක්"** පවත්වා ගෙන යාම අපේ මූලික දැක්මයි.

බස්නාහිර පළාත තුළ පළාත් මාර්ග කිලෝමීටර් 1,952 ක් පවතින අතර මේ වන විට රන් අරුණ I , II සහ III වැඩ සටහන යටතේ රුපියල් මිලියන 17,000 කට ආසන්න මුදලක් වැය කර මාර්ග කිලෝමීටර් 1,352 ක් කාපට් කර අවසන්. එය පළාත් සභාව සතු මාර්ගවලින් සියයට 70 ක් පමණ වෙනවා. තව වර්ෂයක් දෙකක් ඇතුළත ඉතිරි සියලු පළාත් මාර්ග ද කාපට් කර අවසන් කළ හැකි යැයි මා දැඩිසේ විශ්වාස කරනවා.

මාර්ග කාපට් කර රථවාහන වේගයෙන් ගමන් කළ හැකි දියුණු තත්ත්වයට පත් කරන විට ඒවායේ ආරක්ෂාව ඉහළ නැංවීම ද කළ යුතුයි. 2012 - 2017 උපාය මාර්ගික සැලැස්ම යටතේ මාර්ගවල පවතින අනතුරුදායක ස්ථාන 146 ක් හඳුනාගෙන ඇති අතර ඉන් ස්ථාන 71 ක් දැනටමත් නිවැරදිව සකසා අවසන්. 2017 වනවිට රුපියල් මිලියන 550 ක් වැයකර ඉතිරි ස්ථාන ද සකස් කිරීම අපේ බලාපොරොත්තුවයි. 2015 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 150 ක් වෙන් කරනවා.

නවීන මාර්ග පද්ධතියක් සකස් කළත් ඒවා දිගටම නිසි පරිදි නඩත්තු නොකළහොත් ජනතාවට ඉන් ලබා ගත හැකි ප්‍රයෝජනය අවමයි. එම නිසා නඩත්තුව සඳහා මුදල් වෙන් කිරීම ද ඉතා වැදගත් සේ මා දකින අතර ඒ සඳහා මෙම මුදල් ප්‍රකාශයෙන් රුපියල් මිලියන 450 ක් වෙන් කර තිබෙනවා.

මෙම සියලු මාර්ග සංවර්ධන හා නඩත්තු කටයුතු අපගේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරන බව අප කවුරුත් දන්නා කරුණක්. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නවීන තාක්ෂණයෙන්, නවීන යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ඉතා ඉහළ ගුණත්වයෙන් යුතුව මාර්ග සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කරන්නා සේම වෙනත් පළාත්වල සංවර්ධන කටයුතුවලට ද දායක වෙනවා. ඒ අනුව වයඹ හා සබරගමුව පළාත් සභාවල මාර්ග කිලෝමීටර් 792 ක් කාපට් යොදා සංවර්ධනය කර ඇති අතර 2014 දැයට කිරුළ වැඩ සටහන යටතේ ද රුපියල් මිලියන 10,000 ක වැඩ ඉටු කිරීමට බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට රජය මගින් ලබා දී තිබෙනවා. එම පළාත් සභා සඳහා සේවාවක් ලෙස දායක වීමට ලැබීම අප ලැබූ ගෞරවයක් සේ මා දකිනවා.

ඉහත පරිදි ප්‍රතිපාදන සැලසීමට අමතරව, අතිගරු ජනාධිපතිතුමාගේ 2015 අයවැය යෝජනා මගින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිවලට රුපියල් මිලියන 20,000 ක් වෙන් කර තිබෙනවා. මින් බස්නාහිර පළාත් සභාවට අදාළ ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන දිස්ත්‍රික්ක තුනෙහිම ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමට එම මුදල් යෙදවීමට බලාපොරොත්තු වෙනවා.

**සමාජ සේවා :**
SOCIAL SERVICES

ගරු සභාපතිතුමනි, මෑත වසරවලදී දක්නට ලැබුණු ආර්ථික වර්ධනයේ තිරසාර බව හේතුවෙන් 2009 / 2010 වර්ෂවල සියයට 8.9 ක්ව පැවති දිළිඳු කුටුම්බ ප්‍රතිශතය 2012 වසරේදී සියයට 6.5 දක්වා අඩු වෙලා. ඒ වාගේම ආදායම් බෙදී යාමේ අසමානතාවයේ අඩුවීමක් පෙන්නුම් කරමින් 2009 / 2010 දී 0.49 ක්ව පැවති ගිනි සංගුණකය 2012 වසරේදී 0.48 දක්වා අඩු වෙලා. තත්ත්වයන් එසේ පැවතුණත් සහන ලැබිය යුතු දිළිඳු අසරණ ජන කොටස්, පුනරුත්ථාපනය කළ යුතු අනාථ සහ අන්ත දුගී පවුල්, ආධාර ලැබිය යුතු බරපතළ රෝගාබාධවලින් පෙලෙන්නන්, රැකබලා ගත යුතු වැඩිහිටි පුරවැසියන් අප සමාජයේ සිටිනවා. පළාතේ සංවර්ධනයට දායක වූ මෙවන් අයද රැක ගැනීම අපගේ වගකීමක්. එම නිසා මෙම සමාජ සේවා කාර්යයට පුනරාවර්තන වියදම් ඇතුළුව 2015 වර්ෂයේ දී රුපියල් මිලියන 452 ක් වෙන් කර තිබෙනවා. එය 2014 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 8.65 ක වැඩිවීමක්.

2013 වර්ෂයේ පුද්ගලයන් 65,000 කට පමණ රුපියල් මිලියන 282 ක් වැය කර මූල්‍යාධාර සහ ද්‍රව්‍යාධාර ලබා දී තිබෙනවා. 2015 වර්ෂය තුළද ඉහත පරිදි මූල්‍යාධාර සහ ද්‍රව්‍යාධාර ලබා දීම අපගේ බලාපොරොත්තුවයි.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආබාධිත නිවාස 27 ක්, වැඩිහිටි නිවාස 64 ක්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන 14 ක් පවතිනවා. මෙම ස්ථාන වැඩි දියුණු සහ අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින අතර මේවායේ පවතින පහසුකම් ද දියුණු කළ යුතුයි. එම නිසා 2015 වර්ෂයේ දී මෙම ආයතන වැඩි දියුණු කිරීම සඳහා මුදල් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

පළාත් සභා වියදමකින් තොරව ප්‍රජා දායකත්වය යටතේ ක්‍රියාත්මක වන "සුව සෙවන ව්‍යාපෘතිය" අඩු ආදායම්ලාභීන්ට අඩු වියදමින් නිවාස ලබා දෙනවා. 2013 වසරේ දී නිවාස 55 ක් ඉදි කර අඩු ආදායම්ලාභීන්ට පවරා දී තිබෙනවා. ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය දිගටම ක්‍රියාත්මක කිරීම අපගේ අරමුණයි.

**විදුලිබල හා බලශක්ති කටයුතු :**
ELECTRICITY AND POWER AFFAIRS

ගරු සභාපතිතුමනි, වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ පළාත් අතරින් වැඩිම පවුල් ප්‍රමාණයකට විදුලිය පහසුකම් ලැබී තිබෙන්නේ බස්නාහිර පළාත තුළයි. එය මුළු ගෘහ ඒකක ප්‍රමාණයෙන් සියයට 95 ක්. ගෘහ ඒකකවලින් සියයට 4.8 ක් පමණ ආලෝකය සඳහා භාවිතා කරන්නේ භූමිතෙල්. 2016 වනවිට මෙම සියයට 4.8 සඳහා ද විදුලි බලය ලබා දීම අපගේ ඉලක්කයයි. නමුත් ප්‍රදේශයේ විදුලි පහසුකම් තිබුණ ද වෙනත් හේතූන් මත නිවසට විදුලිය ලබා ගැනීම අපහසු පවුල් සිටිනවා. එම ගැටළු අප නිරාකරණය කර දිය යුතුයි.

විදුලි සැපයුම් මාර්ග දීර්ඝ කිරීම, ධාරිතා වැඩිදියුණු කිරීම, විදුලි පහසුකම් ලබා ගැනීමට ඇති ගැටළු නිරාකරණය කිරීම සහ ජාතික පද්ධතියෙන් විදුලිය ලබා දීමට අපහසු ප්‍රදේශ සඳහා කුඩා ජල මූලාශ්‍ර හඳුනාගෙන විදුලිය ලබා දීම වැනි ව්‍යාපෘති ඉදිරි වර්ෂ දෙක තුළ ක්‍රියාත්මක කර 2016 වනවිට සෑම නිවසකටම විදුලිය ලබා දීම අපගේ බලාපොරොත්තුවයි.

**නිවාස සංවර්ධන කටයුතු :**
HOUSING DEVELOPMENT ACTIVITIES

ඉසුරුමත් පවුලක පදනම පදිංචියට නිවාසයක් පැවතීමයි. එමගින් පවුලේ ස්ථාවරත්වය සහතික කර, සංවර්ධන ක්‍රියාවලිය සඳහා ජනතාවගේ පූර්ණ සහභාගිත්වය ලබාදීමට උපකාරී වෙනවා. නිවාස සංවර්ධනයේ විශාල ප්‍රගතියක් අප ලබා ඇතත් තවමත් නිවාස නොමැති පවුල් මෙන්ම ඉතා අඩු ප්‍රමිතියෙන් යුත් නිවාසවල ජීවත් වන මිනිසුන් ද සිටිනවා.

නිවසක් ඉදිකිරීම සඳහා විශාල මුදලක් වැය කළ යුතුයි. පරිභෝජනයට වැය කළ පසු පවුලක ආදායමින් ඉතිරිවන මුදලින් මෙම කාර්යය කිසිසේත්ම කරන්න බැහැ.

එම නිසා දැනට පවතින අපගේ නිවාස ආධාර ක්‍රමය පුළුල් කළ යුතුයි. ඉදිරි වර්ෂය තුළ ගෙවනු ලබන නිවාස ආධාර මුදල වැඩි කරමින් නිවාස සංවර්ධන අරමුදලට රුපියල් මිලියන 45 ක ප්‍රතිපාදන සැලසීමට මා බලාපොරොත්තු වෙනවා.

**මගී ප්‍රවාහන කටයුතු :**
PASSENGER TRANSPORTATION AFFAIRS

ගරු සභාපතිතුමනි, ලාංකීය ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලින් සියයට 63 ක් සපුරා ගන්නේ පෞද්ගලික හා ලංගම බස් රථ මගින්. එම අවශ්‍යතාවයෙන් සියයට 65 ක් සපුරාලන්නේ පෞද්ගලික බස් රථයි. දැනට පළාතේ ධාවනය වන පෞද්ගලික බස් රථ සංඛ්‍යාව 6,300 ක් පමණ වන අතර එය මුළු දිවයිනේම ධාවනය වන පෞද්ගලික බස් රථ සංඛ්‍යාවෙන් සියයට 33 ක් පමණ වෙනවා. පළාත තුළ බස් රථ ධාවනය වන මාර්ග 431 ක් පවතින අතර ඉන් පෞද්ගලික බස් රථ පමණක් ධාවනය වන මාර්ග 234 ක් පවතිනවා.

ගරු සභාපතිතුමනි, පෞද්ගලික බස් රථ 6,300 කට ආසන්න ප්‍රමාණයක් පළාත තුළ ධාවනය කරමින් පෞද්ගලික මගී ප්‍රවාහනයෙන් පළාතේ ජනතාවට කෙතරම් සේවාවක් වෙනවා ද යන්න පැහැදිලි වන අතර ගම සහ නගරය එකතු කරන මාධ්‍යය ප්‍රවාහනයයි.

බස්නාහිර පළාත තුළ ධාවනය වන බස් රථ සංඛ්‍යාව 6,300 ක් වුණත් ඉන් සියයට 38 ක් පමණ අවුරුදු 10 ඉක්ම වූ බස් රථයි. මේ නිසා ඒ ඒ මාර්ග වල සියයට 20 ක් පමණ බස් රථ දිනපතා ධාවනයට පැමිණෙන්නේ නැහැ. මෙය යහපත් ප්‍රවාහන සේවයක් පවත්වා ගෙන යාමට හිතකර තත්ත්වයක් නොවෙයි. ඒ නිසා අවුරුදු 10 ට වඩා පැරණි බස් රථ ධාවනයට සුදුසු ද යන්න පරීක්ෂා කිරීමේ වැඩ සටහනක් පසුගිය වර්ෂයේ දී ක්‍රියාත්මක කළා. සියයට 90 ක් බස් රථ සුවපහසු මගී ප්‍රවාහනයකට නුසුදුසු බවට එම පරීක්ෂණයෙන් ඔප්පු වෙලා. මේ අයට සහන මිලට නව බස් රථ හෝ ලබා දිය යුතු වුවත් පළාත් සභාවට මේ පිළිබඳව තනිවම කටයුතු කළ නොහැකියි. අඩු වශයෙන් මේ අයට බදු සහනයක් හෝ සලසා දිය යුතුයි. ඉදිරියේදී මේ පිළිබඳව රජය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

පළාතේ සමහර මාර්ගවල සියයට 20 සිට සියයට 50 දක්වා වූ බස් රථ ප්‍රමාණයක් අතිරික්තයි. විධිමත් කාල සටහනක් සැකසීමට මෙය බාධාවක් වෙලා. ඒ වාගේම මගී ප්‍රවාහන අධිකාරියට ආදායමක් නොලැබෙමින් සමහර මාර්ගවල පවතින බලපත්‍ර ඉතා විශාල මුදලකට කළු කඩයේ අලෙවි වෙනවා. මෙයට පිළියමක් වශයෙන් ටෙන්ඩර් ක්‍රමය යටතේ නව බලපත්‍ර නිකුත් කරන ලෙස මා උපදෙස් දී තිබෙනවා. එමගින් ලබන වර්ෂය තුළ මගී ප්‍රවාහන අධිකාරිය රුපියල් මිලියන 80 ක පමණ ආදායමක් ලබා ගැනීමට ද බලාපොරොත්තු වෙනවා.

**පශු නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත වීම :**
SELF SUFFICIENCY IN LIVESTOCK PRODUCTION

ගරු සභාපතිතුමනි, පශු සම්පත් නිෂ්පාදනය, කිරි ගව පට්ටි පාලනය සහ කුකුල් පාලනය යන අංශ දෙකකින් සමන්විතයි. අපේ රටේ කිරි අවශ්‍යතාවයෙන් දේශීයව නිපදවන්නේ සියයට 15 ක් පමණ සුළු ප්‍රමාණයක්. මේ අවාසනාවන්ත තත්ත්වයෙන් කඩිනමින් ගොඩ ඒම පශු සම්පත් පිළිබඳව මහින්ද චින්තනයේ මූලික දර්ශනයයි. 70 දශකයේ මුල් භාගය තුළ දේශීය කිරි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 80 ක් දේශීය කිරි නිෂ්පාදනය මගින් සපුරා ගත්තා.

මේ වන විට බස්නාහිර පළාතේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 26.6 ක් පමණ වෙනවා. එය ජාතික නිෂ්පාදනයෙන් සියයට 8 ක්. උපාය මාර්ගික සැලැස්ම යටතේ 2017 වර්ෂයේ අප පළාතේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 30 දක්වා වැඩි කර ගත යුතුයි. මේ සඳහා අප නොයෙක් ක්‍රම අනුගමනය කරනවා. සියයට 95 ක් ගැහැණු පැටවුන් ඉපදවිය හැකි ගව ශුක්‍ර ආනයනය කර දෙනුන් ගැබ් ගැන්වීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම ඉන් එක් පියවරක්. 2014 වසරේදී මේ වැඩ සටහන මගින් දෙනුන් 1,800 ක් ගැබ් ගැන්වීමට අවශ්‍ය ගව ශුක්‍ර ආනයනය කළා. ඉදිරි වර්ෂ දෙක තුළදී එම පැටවුන් බිහි කිරීමට නියමිතයි.

කිරි නිෂ්පාදනයේදී ගොවීන් මුහුණ දෙන විශාලම ගැටළුව තමයි සත්ත්ව රෝග ඇති වීම. රෝග වැළඳුණු වහාම කිරි ගවයින් මියයෑම වළක්වා ගත යුතුයි. රෝග වැළැක්වීමේ කටයුතු සඳහා ලබන වර්ෂය තුළ රුපියල් මිලියන 30 ක් වෙන් කරනවා. ඒ වාගේම සතුන්ගේ ආරය උසස් කර වැඩි නිෂ්පාදනයක් සහිත සතුන් බිහිකිරීමේ සත්ත්ව අභිජනන වැඩ සටහන වෙනුවෙන් රුපියල් මිලියන 9 ක් වෙන් කරනවා.

2013 වර්ෂයේ පළාතේ බිත්තර නිෂ්පාදනය මිලියන 199 ක්. එය ජාතික නිෂ්පාදනයෙන් සියයට 9.6 ක්. 2017 වර්ෂය වනවිට මෙම නිෂ්පාදනය මිලියන 219 ක්

දක්වා වැඩි කර ගැනීම අපේ ඉලක්කයයි. එම ප්‍රවර්ධන කාර්යය සඳහා ලබන වර්ෂය තුළ රුපියල් මිලියන 12 ක් වෙන් කරනවා.

මීට අමතරව අතිගරු ජනාධිපතිතුමාගේ 2015 අයවැය යෝජනා මගින් ගවමඩු හා කුඩා ගොවිපොළවල් දියුණු කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදනයන් ද ලබා දී තිබෙනවා.

**මත්ස්‍ය නිෂ්පාදනය :**
FISH PRODUCTION

ගරු සභාපතිතුමනි, පළාත් අනුව මත්ස්‍ය නිෂ්පාදනය ගතහොත් දකුණු පළාත ප්‍රමුඛ ස්ථානයේ පසුවන අතර තුන්වන ස්ථානයේ පසුවන්නේ බස්නාහිර පළාතයි. පසුගිය වර්ෂ පහ තුළ පළාතේ මත්ස්‍ය නිෂ්පාදනය සියයට 32 කින් පමණ වැඩි වී තිබෙනවා. 2013 වර්ෂයේ බස්නාහිර පළාතේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 93,400 ක් වන අතර මෙය ජාතික නිෂ්පාදනයෙන් සියයට 18 ක් පමණ වෙනවා.

2017 වර්ෂය වනවිට පළාතේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100,000 ක් ලබා ගැනීම අපේ ඉලක්කයයි. මෙම ඉලක්කය කරා ළඟාවීම සඳහා 2013 වර්ෂයේ රුපියල් මිලියන 180 ක් වැය කරමින් ව්‍යාපෘති 46 ක් ක්‍රියාත්මක කළා. දැනට ධීවර කර්මාන්තයේ තිබෙන ප්‍රබලම ගැටළුව පසු අස්වනු හානියයි. එය සියයට 30 ක් පමණ වෙනවා. ලෝකයේ දියුණු රටවල මෙය සියයට 5 ටත් වඩා අඩුයි. මෙය අවම කර ගැනීම සඳහා මත්ස්‍ය පරිහරණ ක්‍රමෝපායන් ධීවර නිෂ්පාදකයින්ට සහ පාරිභෝගිකයින්ට හඳුන්වා දිය යුතුයි. නවීන ගබඩා සහ ප්‍රවාහන පහසුකම් ඇති කළ යුතුයි. අධි ශීතාගාර සහිත ට්‍රක් රථ පහසුකම් පළාත තුළ සුලභ කිරීම වඩාත් සුදුසුයි. මෙකී කාර්යයන් සඳහා ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 27 ක් ද, කොළඹ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 11 ක් ද, කළුතර දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 17 ක් ද, පොදුවේ රුපියල් මිලියන 16 ක් ද වශයෙන් රුපියල් මිලියන 71 ක් ලබන වර්ෂය තුළ වෙන් කරනවා.

මෙයට අමතරව අතිගරු ජනාධිපතිතුමාගේ 2015 අයවැය යෝජනා මගින් ධීවර ප්‍රජාවගේ සමාජ සහ ආර්ථික සංවර්ධනය සඳහා තුන් අවුරුදු වැඩ පිළිවෙළක් සැකසීමටත් ඒ සඳහා 2015 වර්ෂයට රුපියල් මිලියන 750 ක් වෙන් කිරීමටත් යෝජනා කර තිබෙනවා. මින් අප පළාතට වෙන් වන ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන මීගමුව, බේරුවල සහ මොරටුව යන ප්‍රදේශවල එම තුන් අවුරුදු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

**සමුපකාර සංවර්ධන කටයුතු :**
COOPERATIVE DEVELOPMENT ACTIVITIES

ගරු සභාපතිතුමනි, දීර්ඝ ඉතිහාසයක් පවතින සමුපකාරය වටා තවමත් අපේ ග්‍රාමීය ජනතාව ගොනු වී සිටිනවා. ඒ කෙරෙහි ඔවුන්ගේ විශාල විශ්වාසයක් පවතිනවා.

සමුපකාර ආයතන නියාමනය, මූල්‍ය හා තාක්ෂණික පහසුකම් සැපයීම, සමුපකාර ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම සහ අධ්‍යාපනය හා පුහුණුව සමුපකාර පිළිබඳව අප වෙත පැවරී තිබෙන ප්‍රධාන විෂයයන්.

ග්‍රාමීය බැංකු සංගම්වලින් තවමත් අපේ ජනතාවට උපරිම සේවය ඉටු වනවාද යන්න ගැටළුවක්. ඒවායේ පවතින මුදල් නිශ්ක්‍රීයව පැවතීම සුදුසු නැහැ. එම මුදල් සාමාජික ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා යෙදවිය යුතුයි. ඒ පිළිබඳ දැනටමත් වැඩ පිළිවෙළක් සකසා අවසන්. ණය යෝජනා ක්‍රමවල යොදවා එම මුදල්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමත් ජනතාවගේ ආදායම වැඩි කර ගැනීමට උදවු කිරීමත් අපේ මූලික සැලැස්මයි.

තවමත් අප භාවිතා කරන්නේ 1973 වර්ෂයේ රජය විසින් පනවන ලද සමුපකාර රීතියි. කාලීනව ජනතා අවශ්‍යතා සඳහා එම රීති සංශෝධනය විය යුතුයි. සමුපකාර ප්‍රඥප්තිය සංශෝධනය කරමින් නව රීති පැනවීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇති අතර 2015 වර්ෂයේ මුල් භාගයේදී එය අවසන් කිරීමට අපේක්ෂා කරනවා.

පශු සම්පත් කටයුතු හා සමුපකාරය එකට බද්ධ වී ගමන් කළ යුතු යැයි මා විශ්වාස කරනවා. වාණිජ සමුපකාර සමිති පමණක් නොවෙයි පශු නිෂ්පාදන සමුපකාර සමිති ද පළාත තුළ ප්‍රචලිත කළ යුතුයි. ඒ කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරන ලෙස මා සමුපකාර දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබෙනවා. මෙකී කාර්යය වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා ලබන වර්ෂය තුළ රුපියල් මිලියන 15 ක් වෙන් කරනවා.

**ක්‍රීඩා සංවර්ධනය :**
SPORTS DEVELOPMENT

ගරු සභාපතිතුමනි, පසුගිය දශකය තුළ අප පළාතේ ක්‍රීඩාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබෙනවා.

2013 වර්ෂයේ ජාතික ක්‍රීඩා උළෙලේදී පදක්කම් 191 ක් ලබා ගනිමින් බස්නාහිර පළාතට ශූරතාවය දිනා ගැනීමට හැකි වුණා. ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරි ගැන්වීම වාගේම දෙවන පෙළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් ඇති කිරීම ඉතාම වැදගත්. මේ කෙරෙහි අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. මෙකී කාර්යය සඳහා ලබන වර්ෂය තුළ රුපියල් මිලියන 46 ක් වෙන් කරනවා.

විභාගය පමණක් මුල් කරගත් අධ්‍යාපන රටාවකට වර්තමානයේ ළමුන් තල්ලු වෙමින් යන නිසා ළමුන් ක්‍රීඩාව දෙසට යොමු කිරීම ඉතා වැදගත්. පාසල් ළමයෙකුට දියවැඩියාව පවතිනවානම් එය විශාල ගැටළුවක්. සෑම දරුවෙක්ම පාසල තුළ අවම වශයෙන් කුමන හෝ එක් ක්‍රීඩාවක නිරත විය යුතු බවට අනිවාර්යය කළ යුතුයි.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය එකතු වී මේ සම්බන්ධව විශේෂ වැඩ පිළිවෙලක් සැකසිය යුතු යැයි මා යෝජනා කරන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද සලසනවා.

**කාන්තා කටයුතු :**
WOMEN'S AFFAIRS

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ මුළු ජනගහනයෙන් සියයට 51 ක් කාන්තාවන්. වර්තමාන කාන්තාව අතීතයේ මෙන් ගෘහස්ථ වැඩ කිරීමේ කාර්යයේ පමණක් නියැලී නොසිට පවුලේ ආදායම් ඉපයීමේ කොටස්කරුවෙක් වී තිබෙනවා. පවුලේ ආදායම වර්ධනය කර ගැනීමට කාන්තාව දරන උත්සාහය අප අගය කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය දිරිය ලබා දිය යුතුයි. එහෙයින් පළාත් කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම කාන්තා ව්‍යවසායකයින් 100 දෙනෙකුගෙන් සමන්විත සංගමයක් පිහිටුවීමත් ඒ යටතේ තමන්ගේ උත්සහයෙන් ස්වයං රැකියා කිරීමට අවශ්‍ය කාන්තා ව්‍යවසායකයන්ට රු.10,000 ක ආධාර මුදලක් ලබා දීමටත් මා යෝජනා කරනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**ග්‍රාම සංවර්ධන කටයුතු :**
RURAL DEVELOPMENT AFFAIRS

ගරු සභාපතිතුමනි, පළාතේ ප්‍රජා සංවිධාන මෙහෙයවීම හා අධීක්ෂණය ග්‍රාම සංවර්ධන අංශය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීමයි. ක්‍රියාකාරී සාමාජිකයින් 152,000 ක් පමණ සිටින පළාත පුරා විහිදී ගිය ග්‍රාම සංවර්ධන සමිති 2,141 ක් පවතින අතර එම සමිතිවල පවතින මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 215 ක් පමණ වෙනවා. මෙම සාමාජිකයින්ගෙන් සහ වත්කම්වලින් උපරිම ඵලදායිතාවයක් මෙතෙක් අප ලබා ගෙන තිබේ ද යන්න ගැටළු සහගත තත්ත්වයක්. ග්‍රාමීය ජනතාවගේ ආර්ථික හා සමාජයීය අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී මෙම සංවිධානවලට කළ හැකි කාර්යභාරය ඉතා විශාලයි. එම නිසා මෙකී සංවිධාන තවදුරටත් සවිබල ගැන්වීමටත්, ඒවායේ ඵලදායීතාවය සමාජයට ලබා දීමටත් රුපියල් මිලියන 42 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**සංචාරක ප්‍රවර්ධන කටයුතු :**
TOURISM PROMOTION AFFAIRS

2016 වනවිට වසරකට සංචාරකයින් ලක්ෂ 25 ක් මෙරටට ගෙන්වා ගැනීම සංචාරක කර්මාන්තය පිළිබඳව මහින්ද චින්තනයේ මූලික වැඩ පිළිවෙලයි. එයට අනුගත වෙමින් බස්නාහිර පළාත තුළ සංචාරක ආකර්ශනීය ස්ථාන ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම යන ප්‍රමුඛ පරාසයන් ඔස්සේ කටයුතු කරනවා. 2013 වර්ෂයේ පමණක් මෙවන් ව්‍යාපෘති රාශියක් වෙනුවෙන් රුපියල් මිලියන 35 ක් වැය කර තිබෙනවා.

අපගේ සංචාරක මණ්ඩලය මගින් පළ කරනු ලබන **"ඇමේසිං ශ්‍රී ලංකා "** සඟරාව සඳහා ලෝකය තුළ විශාල ඉල්ලුමක් පවතිනවා. එම සඟරාව වෙනුවෙන් පසුගිය වර්ෂය තුළ රුපියල් මිලියන 7.5 ක් වැය කර තිබුණත් එමගින් සංචාරකයින් ආකර්ෂණය කිරීම නිසා ලැබෙන ප්‍රතිලාභය විශාලයි. සංචාරක කර්මාන්තය වෙනුවෙන් ඉහත ප්‍රමුඛ පරාසයන් යටතේ කටයුතු කිරීම සඳහා රුපියල් මිලියන 65 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

**කෘෂිකාර්මික සංවර්ධනය :**
AGRICULTURAL DEVELOPMENT

ගරු සභාපතිතුමනි, මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තියට අනුව 2015 වර්ෂය සඳහා වාර්ෂික වී නිෂ්පාදන ඉලක්කය මෙට්‍රික් ටොන් මිලියන 6.5 ක්. මෙම ජාතික ඉලක්කය කරා යාමේදී බස්නාහිර පළාතේ වී වගාව සඳහා වෙන් වී ඇති හෙක්ටයාර් 37,389 ක් වැනි සුළු භූමි ප්‍රමාණයෙන් 2015 වර්ෂය තුළ මෙට්‍රික් ටොන් මිලියන 0.147 ක ඉලක්කයක් සපුරා ගැනීමට සැලසුම් කර තිබෙනවා.

ජලය හා ඉඩම් හිඟයෙන්, වගා පාළුවෙන්, අස්වනු විකුණාගත නොහැකිව සහ නව ක්‍රමෝපායන් නොමැතිකමෙන් අපේ ගොවීන් විඳින දුක් ගැහැට අපමණයි. පළාතේ ගොවීන් සමඟ මා නොයෙක් අවස්ථාවල දී කතා කර තිබෙනවා. ඔවුන්ගේ මූලික ඉල්ලීම ප්‍රමිතියෙන් යුත් බීජ සහ රෝපණ ද්‍රව්‍ය වෙළෙඳපොළ තුළ සුලභ කරන ලෙසයි.

දළ දේශීය නිෂ්පාදයෙන් පළතුරු නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් දක්වන්නේ බස්නාහිර පළාතයි. රඹුටන්, අන්නාසි, වැල් දොඩම්, කෙසෙල්, පැපොල් සහ මැංගුස් වැනි පළතුරු ඉතා සාර්ථකව අපේ පළාතේ වගා කරන්න පුළුවන්. 2013 වර්ෂයේ දී හෙක්ටයාර් 8,085 ක පමණ පළතුරු වගා කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් තිබෙන මූලික ගැටළුවත් ප්‍රමිතියෙන් යුත් බීජ හා රෝපණ ද්‍රව්‍ය නොමැතිකමයි. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන ලෙස මා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබෙනවා. ඒ අනුව 2012 - 2017 මධ්‍යකාලීන ආයතනික ප්‍රතිඵල රාමුවට අනුව ලියාපදිංචි බීජ ගොවිපලවල් පිහිටුවීම, ද්විතියික බිත්තර වී ගොවිපලවල් පිහිටුවීම, බිත්තර වී නිෂ්පාදනය සඳහා ගොවීන් සංවිධානය කිරීම හා සවිබල ගැන්වීම වැනි උපාය මාර්ගික සැලසුම් දැනටමත් ක්‍රියාත්මක කරනවා. මෙකී කාර්යය සඳහා 2015 වර්ෂය තුළ රුපියල් මිලියන 71 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, දවසේ පාසල් කාලය අවසන් වූ පසු නැතහොත් සෙනසුරාදා හෝ ඉරිදා දෙමව්පියන් සමඟ කොරටුවට, කුඹුරට යෑම අතීතයේ අපේ දරුවන්ට පුරුද්දක්ව තිබුණා. නමුත් වර්තමානයේ ක්‍රමයෙන් එය ගිලිහී යන බව පෙනෙනවා. මේ නිසා කෘෂිකර්මයේ ඇති වැදගත්කම දරුවන්ගේ මනසින් ඈත්වෙමින් යනවා. මෙය තේරුම් ගත් අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය පසුගිය වර්ෂ කීපයේම පාසල්වල කෘෂි සමාජ පිහිටුවීමට කටයුතු කළා. මේ වන විට පාසල්වල කෘෂි සමාජ 650 ක් පමණ පවතින අතර 2015 වර්ෂයේදී තවත් කෘෂි සමාජ 180 ක් පමණ පිහිටුවීමට බලාපොරොත්තු වෙනවා.

**වාරි තාක්ෂණය :**
IRRIGATION TECHNOLOGY

ගරු සභාපතිතුමනි, පොළොව මතුපිට තිබෙන ජල සම්පතින් සියයට 80 ක් පමණ වර්තමානයේ වාරි අංශය සඳහා යොදා ගන්නවා. අනෙකුත් අවශ්‍යතා සපුරා ගන්නේ ඉතිරි සියයට 20 න්. පොළොව මතුපිට පවතින ජලයෙන් වාරි අංශයේ කටයුතු සඳහා යොදා ගන්නා ජල පරිමාව සියයට 60 දක්වා අඩු කර ගැනීම මහින්ද චින්තනයේ අරමුණයි. ඒ සඳහා වාරි මාර්ග කටයුතු තාක්ෂණික කිරීමත්, ජල කළමනාකරණයත් ඉතා වැදගත්. අපතේ යන ජලය අඩු කර ගැනීම සඳහා වාරි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම, ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය සහ පර්යේෂණ හා සංවර්ධනය වැනි කාර්යයන් කළ යුතුයි. ඒ සඳහා 2013 වර්ෂයේ රුපියල් මිලියන 44 ක් වැයකර ව්‍යාපෘති 116 ක් ක්‍රියාත්මක කළා. 2015 වර්ෂයේ ද මෙවැනි ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 52 ක් මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**කර්මාන්ත :**
INDUSTRIES

ගරු සභාපතිතුමනි, වාර්ෂික වර්ධන වේගය සියයට 11 ක් සේ පවත්වා ගනිමින් වසර 2020 වන විට දළ දේශීය නිෂ්පාදනයට කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය සියයට 40 දක්වා ඉහළ නැංවීම අපේ රටේ ජාතික ප්‍රතිපත්තියයි. මෙයට අනුගතව අපේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත උපාය මාර්ගික සැලසුම් සකස් කර තිබෙනවා.

දැව, රෙදිපිළි, කෙඳි හා පන්, ලුහු ඉංජිනේරු, මැටි, සම් සහ කොහු වැනි ද්‍රව්‍ය භාවිතා කරමින් කටයුතු කරන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වර්ග 50 කට වැඩි සංඛ්‍යාවක් අප පළාතේ පවතිනවා. මෙම කර්මාන්ත පළාත තුළ ක්‍රියාත්මක වන්නේ ස්වයං රැකියා වශයෙනුයි. මෙම කර්මාන්තයන්හි නියැලෙන ජනතාවගේ ආදායම වැඩි කර දීම සඳහා කටයුතු කිරීම අපගේ වගකීමක්. ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම, පුහුණුව හා දැනුම ලබා දීම සහ වෙළෙඳපොළ අවස්ථා ඇති කරලීම වැනි කාර්යයන් දැනටමත් කරනු ලබන අතර ඒ සඳහා තවදුරටත් ප්‍රතිපාදන සැලසිය යුතුයි. මැටි කර්මාන්තය දියුණු කිරීම සඳහා රුපියල් ලක්ෂ 47 ක් වැය කරමින් බියගම මැටි කෞතුකාගාරයක් ඉදි කළ අතර මැටි කර්මාන්තයේ ඉතිහාසය, විකාශය, භාවිතා කරන මෙවලම් හා උපකරණ පිළිබඳව තොරතුරු මෙහි ඇතුළත්ව තිබෙනවා.

පාසල්වල ඩෙස්ක්, බංකු සහ පුටු අලුත් වැඩියා කරන **"බිඳුණු පුටුවට දැතේ සවිය"** ව්‍යාපෘතිය නිසා අලුතින් ඩෙස්ක්, බංකු සහ පුටු ලබා ගැනීමට වැය කළ යුතු මුදල

විශාල ලෙස අඩු වෙලා. මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් 850 ක අබලන් වූ ඩෙස්ක්, බංකු සහ පුටු මේ වන විට අලුත් වැඩියාව සිදු කර ඇති අතර එහි නිමවුම් වටිනාකම රුපියල් මිලියන 220 ක් පමණ වෙනවා. මෙම වර්ෂයේ රුපියල් මිලියන 9.15 ක් වැය කර පාසල් 18 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

හීන් නූල් රෙදි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා එම ශ්‍රමික පවුල්වල ආදායම වැඩි කිරීමේ චේතනාවෙන් පසුගිය වර්ෂයේ අයවැයෙන් රු.350/- ක් වූ දෛනික දීමනාව රු.650/- ක් දක්වා වැඩි කළා. එම වැඩි කිරීම කළත් මෙම ග්‍රාමීය කාර්මිකයන්ගේ ආදායම තවමත් ඉතා පහළ මට්ටමක පවතිනවා යැයි මාගේ විශ්වාසයයි. එම නිසා රු.100/- ක් වූ ඔවුන්ගේ දෛනික පැමිණීමේ දීමනාව රු.200/- දක්වා වැඩි කිරීමට මා යෝජනා කරනවා.

**නිල්ල පිරුණු පරිසරයක් :**
A GREENER ENVIRONMENT

ගරු සභාපතිතුමනි, ස්වභාවික ගස්වැල්, ඇළ දොළ, ජල පෝෂිත ප්‍රදේශ, සතා සිවුපාවුන්ගෙන් සමන්විත ජෛව විවිධත්වයට හානි කිරීම නිසා සමස්ත ලෝකයම අති දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබෙනවා. මේ නිසා අප පළාතේ සංවර්ධනයේ අඩිතාලම නිල්ල පිරුණු පරිසරයක සිදු විය යුතුයි. පරිසරය රැක ගැනීම තේමාව කර ගනිමින් නොයෙක් වැඩ සටහන් පසුගිය කාලය තුළ අප ක්‍රියාත්මක කළා. විශේෂයෙන් ඒ සඳහා නීති රීති පැනවීම ද සිදු වුණා. නාගරික කෘෂිකර්මය ප්‍රචලිත කිරීම සඳහා ප්‍රතිපත්ති 13 ක් ඇතුළත් නාගරික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ගැසට් කළ අතර මෙම ව්‍යාපෘතිය යටතේ පරිසරයට හානි නොවන අයුරින් නාගරික කෘෂිකර්මය ප්‍රචලිත කිරීමට බලාපොරොත්තු වෙනවා.

"පරිසරය පිළිබඳව පවතින තිරසාර සංවර්ධනය සඳහා වන ප්‍රාන්ත රාජ්‍යයන්ගේ එකමුතුව" ජාත්‍යන්තර සංවිධානයේ සාමාජිකත්වය 2012 වසරේදී අප පළාත් සභාවට හිමි වූ අතර පරිසරය රැක ගැනීම සඳහා පළාත් සභාව කරන ලද කාර්යභාරය හේතුවෙන් 2014 වර්ෂයේ දී එම සංවිධානයේ සම සභාපතීත්වය නිතරඟයෙන් බස්නාහිර පළාත වෙත හිමි වුණා. ලංකාවේ පළාත් සභාවක් සිය ඉතිහාසය තුළ ජාත්‍යන්තර සංවිධානයක නිලයක් ලබාගත් ප්‍රථම අවස්ථාව මෙයයි. මෙය අපට ආඩම්බර විය හැකි කරුණක් සේ මා දකිනවා. කෙසේ වුවත් කුමන බාධක පැමිණියත් පරිසරය රැක ගැනීමට අප තිරසාරව දායක විය යුතු යැයි මා විශ්වාස කරන අතර ඒ වෙනුවෙන් මෙම මුදල් ප්‍රකාශයෙන් රුපියල් මිලියන 20 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

**සංස්කෘතිය සහ කලාව :**
CULTURE AND ART

ගරු සභාපතිතුමනි, ජනතාවගේ අධ්‍යාත්මික ගුණධර්ම සහ සාමකාමී දිවි පැවැත්ම සඳහා සංස්කෘතිය විශාල පිටිවහලක් වෙනවා. ඒ සඳහා ආගමික හා සංස්කෘතික කටයුතුවල නියැලීමට ජනතාවට අවස්ථාව තිබිය යුතුයි. පසුගිය දශක තුන තුළ පැවති කුරිරු යුද්ධය හේතුවෙන් මෙම අවස්ථාව ජනතාවගෙන් ගිලිහී ගිය අතර එම අහිතකර තත්ත්වයන් ජනතාවගේ අධ්‍යාත්මික ගුණධර්ම සහ සාමකාමී දිවිපැවැත්ම පිරිහී යාමට හේතු වුණා. නමුත් යුද්ධය අවසන් වීමත් සමඟ නැවත වරක් ජනතාව ඒ කෙරෙහි යොමු වී තිබෙනවා. මේ සඳහා හැකිතාක් ඉඩ සලසා දීම සංස්කෘතිය පිළිබඳව අපේ රජයේ ප්‍රතිපත්තියයි. අප පළාත් ප්‍රතිපත්තියත් එයයි. එය ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් නොයෙක් වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර 2014 වර්ෂයේ රුපියල් මිලියන 30 ක් මේ සඳහා වෙන් කර ඇති අතර 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 44 ක් වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

බස්නාහිර පළාත් සෞන්දර්යය නිකේතනය ගිලිහී යන සංස්කෘතික අංග රැක ගැනීම සඳහා විශාල මෙහෙයක් කරනවා. විශේෂයෙන් සංචාරකයින් උදෙසා කොළඹ 07 Arcade පරිශ්‍රය කේන්ද්‍ර කර ගනිමින් දෛනික නර්තන ප්‍රසංග පැවැත්වීම එම ආයතනයේ බලාපොරොත්තුවයි. ඒ වාගේම ලොව සුපතළ චිත්‍රපටි, අනුරංග ශාලාවේ ප්‍රදර්ශනය කිරීම, කෙටි චිත්‍රපටි සැකසීම වැනි පාඨමාලා ක්‍රියාත්මක කිරීම, නාට්‍ය පුහුණුවීම් සඳහා අවශ්‍ය ශාලා පහසුකම් කලාකරුවන් වෙත ලබා දීම වැනි කාර්යයන් මෙම ආයතනය මගින් ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. එම ආයතනය සඳහා ද 2015 වර්ෂයට රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදන සැලසීමට මා යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ රට, අපේ පළාත දැන් එක්තරා සංධිස්ථානයකට පැමිණ තිබෙනවා. එය පළාතේ ජනතා අපේක්ෂාවන් ඉටුකිරීමේ වේගවත් ගමන් මගකට ප්‍රවේශවීම සඳහා ලැබුණු විශේෂිත අවස්ථාවක් කියා මා විශ්වාස

කරනවා. මතුපිටින් පැවති ත්‍රස්තවාදය අප විනාශ කළත් එය පිටුපස සිටි බලවේග තවමත් ක්‍රියාත්මක වෙනවා. එය අපේ රටේ සාමය හා ජාතික සංහිඳියාව පුළුල් කිරීමට මෙන්ම ජාත්‍යන්තර සහයෝගීතාවය ශක්තිමත් කිරීමට බාධාවක්. එම බාධක මැඩගෙන අනාගත අභියෝග ජයගැනීම අපේ ජාතික වගකීමයි. එබැවින් මතු පරපුර වෙනුවෙන් පළාතේ සමාජ හා ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා එක්වන ලෙස සියලු දෙනාටම මා ගෞරවයෙන් ආරාධනා කරනවා.

**ස්තුතිය**

මෙතෙක් වේලා අයවැය කථාවට සවන් දුන් ඔබ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. 2015 මුදල් ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මහත් කැපවීමෙන් කටයුතු කළ ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු පළාත් භාණ්ඩාගාරයේ අයවැය අංශයේ සියලුම නිලධාරීන්ටද, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ටද, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටද, අනෙකුත් කාර්යාලවල ආයතන ප්‍රධානීන්ට ද මාගේ හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේ දී පුදකර සිටිනවා. එමෙන්ම වාර්තා කිරීමේ යෙදී සිටි ජනමාධ්‍යවේදීන්ටද, සංවිධාන කටයුතු සහ පහසුකම් සැපයූ සභා ලේකම් ඇතුළු එම කාර්යය මණ්ඩලයට ද, නන් අයුරින් මේ සඳහා දායක වූ සියලු දෙනාටද මගේ අවංක ස්තුතිය පුද කරමින් මාගේ අයවැය කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

## 2015 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :

APPROPRIATION STATUTE RELEVANT TO THE FINANCIAL STATEMENT OF 2015

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

*ගරු සභාපතිතුමනි, "2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය." යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම මුදල් ප්‍රකාශය හා විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ ඉදිරි කටයුතු 2014 දෙසැම්බර් මස 01, 02, 03 හා 04 දිනවලදී පැවැත්වෙන බවත් ගරු මන්ත්‍රීවරුන්ට කාරුණිකව දැනුම් දෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු මහ ඇමැතිතුමා, අපට ඒ විවාදයට ඉඩ දෙනවා නේද? මේ දවස්වල උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාත් ඉස්පිරිතාලේ. සෝභිත හාමුදුරුවෝ ඉස්පිරිතාලේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. තව ඉවර නැහැ. ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. තව ඉවර නැහැ.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය කථා පවත්වන්න යන්න එපා.

[සභාවේ ඝෝෂා]

තව ඉවර නැහැ. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. පොඩ්ඩක් ඉවර කරන්න ඉඩ දෙන්න. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඉවර කරගන්න කල් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපට විවාදයට ඉඩ දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙනවා. දෙනවා. අනිවාර්යෙන් දෙනවා.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. න්‍යාය පත්‍රයේ වැඩ තව ඉවර නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න කෝ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු මහ ඇමැතිතුමා අයවැය කියවනකොට ඇමැති කෙනෙක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කමක් නැහැ. අසනීප වෙනවා නේ? ඒ වාගේම දෙසැම්බර් මස ඉදිරිපත් කරන අයවැය විවාදය සම්බන්ධයෙන් සභාව ආරම්භ වන්නේ පෙ.ව. 09.00 ට බව මම ගරු මන්ත්‍රීවරුන්ට කාරුණිකව දැනුම් දෙනවා. එසේම සභාව අවසන් වෙන්නේ ප.ව. 05.00 ට බවත් දැනුම් දෙනවා.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපි මේ සභාවට තේරී පත් වුණු මාර්තු මාසයේ 29 වැනිදා ඉඳලා මේ දක්වා අපට ලැබුණු උපමාන පාදක ප්‍රදාන වැඩ සටහන්වලට අදාළ ඒ ප්‍රතිපාදන මේ දක්වා නිදහස් කරගන්න බැරි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම තුළ ඒ ලැබුණු ප්‍රතිපාදනවලින් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අපි වෙන් කරපු ප්‍රතිපාදන කිසිවක් මේ දක්වා අපට නිදහස් කරගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම 2014 වර්ෂයේ ලෝක ළමා දිනය වෙනුවෙන් මම වෙන් කරපු ව්‍යාපෘතියකට අදාළ මුදල් මේ දක්වා නිදහස් නොකිරීමට - ඔක්තෝබර් මාසයේ 03 වැනිදා පටන් අරගෙන 18 වැනිදා දක්වා කරන්න බලාපොරොත්තු වුණු මේ ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තුවවත් තවම අනුමත කරන්න ප්‍රාදේශීය ලේකම්වරයා ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි මේ දක්වා කිසිම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමකට මන්ත්‍රීවරු විධියට අපට ආරාධනයක් ලැබිලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම කරුණු සම්බන්ධයෙන් සොයා බලා ඔබතුමාව ඒ පිළිබඳව මම දැනුවත් කරන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම දැන් ගරු මහ ඇමැතිතුමා අයවැය ප්‍රකාශය ඉදිරිපත් කරන්න කලින් ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා, බස්නාහිර පළාතේ දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කරන්නත් ටියුෂන් පන්ති තහනම් කළ යුතුයි කියලා මා යෝජනාවක් ගෙනාවේ නැහැ. බොරු කියලා. ඒ නිසා මම කියන්න කැමැතියි 2014.08.06 වැනිදා සභා කටයුතු කාරක සභා රැස්වීමට මම ඒ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා බොරුවක් කිව්වේ. එතුමා බොරු කියලා මගේ වරප්‍රසාද කඩ කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ප්‍රශ්නය වරප්‍රසාද කමිටුවට යොමු කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මම බොරු කිව්වේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කිව්වේ එහෙම දෙයක් අපට වාර්තා වෙලා නැහැයි කියලා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මම ඒ යෝජනාව සභා කටයුතු කාරක සභාවට -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි මීට පෙර ඔය යෝජනාවට අවශ්‍ය කටයුතු කරලා තිබ්බන්නේ. මාධ්‍යවලට -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

යෝජනාව මම දාලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔය යෝජනාව අපි ගෙනැල්ලා ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එහෙම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසයි මම දාලා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරස ඇවිල්ලද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවේ ඉන්න සියලු මන්ත්‍රීවරු දන්නවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් - ගරු මහ ඇමැතිතුමා කථා කරන්නේ. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ පළාත් සභාවේ හිටපු ආණ්ඩු පක්ෂයේ, විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු දන්නවා, අපේ ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව මේ පළාත් සභාවට යෝජනාවක් ගෙනැල්ලා ඒ සම්බන්ධව මේ වනකොටත් අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා, ඒ තොරතුරු අරගෙන මේ වන විට ඒ අදාළ ප්‍රඥප්තිය සකස් කිරීමත් කරනවා. ඉතින් මම දන්නවා, එතුමා සිරස බලාගෙන කථා කරපු යෝජනාවක්.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමා කිව්වේ, ඒ යෝජනාව මම ගෙනාවේ නැහැයි කියලා. ගෙනැල්ලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

දැන් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා අයින් වෙලා ඉන්නේ. අපේ පැත්තට අවාම අපට තමයි කරන්න වෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔය සිරස ආයතනයත් විනාශ කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමාගේ අදහස නේ ඒක.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශ්ශබ්දව ඉන්න කෝ. මයික් ටික Off කරගන්න.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඔබතුමා අයවැය විවාදය සඳහා දෙසැම්බර් මාසයේ 01, 02, 03 හා 04 ලෙස දින වකවානු වෙන් කළා. එය වාර්ෂික රැස්වීම් මාලාවේ නැහැ. ඒ නිසා එම දින හතර කරුණාකර බන්ධනාගාරය වෙත දන්නවන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි ඒක දැනුවත් කරන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද කථා කරන්නේ. 36(1) ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න එහෙම කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඇත්තෙන්ම ස්තුතිවන්ත වෙනවා. සමහර වේලාවට පිපාසයක් හැදුනාම අපට කෝපි ටිකක් බොන්න මේ දෙපැත්තේ අවශ්‍ය මැෂින් තියලා තිබෙනවා. නමුත් අද මන්ත්‍රීවරු ගණනාවක් ගියා. කෝපි වෙනුවට ඒ මැෂින් එකේ එන්නේ වතුර. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්. අපට ඒ නිසා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. ඉදිරි සභාව වන විට අපි ඒක ලැහැස්ති කරලා දෙන්නම්. අඩුවක් නැතිව කෝපි බොන්න. ඔබතුමාට අපි ආරාධනා කරනවා. කෝපි බොන්න අවස්ථාව ලබා දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම නිතරම ගරු මහ ඇමැතිතුමාගේ කෝපි එක බොන මනුස්සයෙක්. අපි මෙතුමා මොකුත් කිව්වාට ගණන් ගන්නේ නැහැ. මේ රණතුංග පවුලේ කෙනෙක් තමයි ඉස්සරහාට අනාගතයේ ගේන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොමත්ම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි හැමෝගෙම අදහස් එළියේ ජනතාවට ගෙනියන්නේ මාධ්‍ය ආයතන. ඉතින් විශේෂයෙන්ම අර උඩ මහලේ ඉන්න මාධ්‍ය ආයතනවල අයගේ ඉල්ලීමක් තිබුණා, ඔවුන්ට මේ සභා ගැබට වොයිස් රෙකෝඩර් එකක් ගේන්න දෙන්නේ නැහැයි කියලා. මොකද හේතුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම බලන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු මහ ඇමැතිතුමා අයවැය කියන එක ඔවුන්ගේ මාධ්‍යවල මේ කට හඬින්ම ප්‍රචාරය කරන්න විධියක් නැහැ. ඒක නිසා විශේෂ අවධානය යොමු කරලා ඒ අවස්ථාව සලසා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 12.50 ට, 2014 දෙසැම්බර් මස 01 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.50 p.m till 09.00 a.m, on 01.12.2014*